Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

උකුස්සෝ සහ පරෙවියෝ
සාම සාධනය සහ ගැටුම් නිරාකරණය

විබකේ හැන්සන්, ඔලිවර් රැම්ස්බොතම්, ටොම් වුඩ්හවුස්
(Wibke Hansen, Oliver Ramsbotham, Tom Woodhouse)

www.berghof-handbook.net

1. හැඳින්වීම 376
2. සාම සාධනයේ පරිණාමය සහ සංවර්ධනය 377
  සාමසාධනයේ සංවර්ධනය 1956 - 1988 377
  එක්දහස් නවසිය අසූ ගණන්වල පසුවන් සීතල යුද සමයේ සාම සාධනය 378
3. සාම සාධනයට ඇති නව අභියෝග 381
4. සාම සාධන කාර්යයේ නව නැඹුරුවයන් 383
5. ගැටුම් පර්යේෂණ සහ න්‍යාය ගොඩනැගීම 385
  ගැටුම් විශ්ලේෂණය සහ මානුෂවාදී මැදිහත්වීම 387
  ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සහ ගැටුම් නිරාකරණය 389
  සාම සාධනය සහ ගැටුම් නිරාකරණය සහ නිපුණතා සහ පුහුණුවීම 391
6. උගත් පාඩම් සහ න්‍යාය 393
7. අනාගත ප්‍රමුඛතා 397
  ගැටුම් අර්බුද සම්බන්ධයෙන් තාක්ෂණික ප්‍රතිචාර හැකියාව දියුණු කිරීම 397
  බහුවිධ සම්බන්ධීකරණය, තුලනය සහ වෙන් කොට හඳුනා ගැනීම 399
  නීතිය ආරක්ෂා කිරීම සහ සාම සාධනයේ සිවිල් කාර්යයන් 405
8. අනාගත විකල්ප 405
9. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම 409

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

උකුස්සෝ සහ පරෙවියෝ සාම සාධනය සහ ගැටුම් නිරාකරණය

විබ්කේ හැන්සන්, ඔලිවර් රැම්ස්බොතම්, ටොම් වුඩ්හවුස්
(Wibke Hansen, Oliver Ramsbotham, Tom Woodhouse)

1. හැඳින්වීම

සීතල යුද්ධය අවසන් වූ කාලයේ සිට එක්සත් ජාතීන්ගේ සාම සාධනය සම්බන්ධයෙන් වූ සංකල්ප සහ භාවිතය යන කාරණා දෙකම සෑහෙන ප්‍රමාණයක වෙනස්වීම්වලට භාජනය වී ඇත. සීතල යුද්ධය පවතින කාලයේ දී හමුදා යෙදවීම සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරන ලද්දේ අපක්ෂපාතී සහ ගැටුම්වල යෙදී සිටින පාර්ශවයන් ගේ අනුමැතිය සහිතව බලහත්කාරයෙන් තොර මැදිහත්වීම සහ ප්‍රතිපත්ති මත සහ සාමය පිළිබඳ එකඟත්වයකට පැමිණීමේ පූර්ව කොන්දේසිය මත වන අතර, වඩා මෑතකදී සාම සාධන මෙහෙවර වැඩි වශයෙන් කර ඇත්තේ අභ්‍යන්තර යුද්ධ වලට අදාළවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් තිව්‍ර වන මතභේදකාරී තත්ත්වයකට පත් වී ඇති අතර, මෑතකදී කරන ලද එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් තදබල විවේචනයට ලක් වී ඇත. බොස්නියාවේ දී එය ක්‍රියාත්මක වූ ප්‍රමාණය අඩු බවටත් සෝමාලියාවේ දී වැඩි බවටත් වශයෙන් විවිධාකාරයෙන් චෝදනාවට ලක් වී ඇත. මෙම විවේචනයන්ට ප්‍රතිචාරයක් වශයෙන් ජාතික හා ජාත්‍යන්තර (එක්සත් ජාතීන්) යන තලයන් දෙකෙහි දී ම සාම සාධනය පිළිබඳව අලුත් ආකාරයකින් චින්තනයන් ගොඩනැගී ඇත. විශේෂයෙන් ම සෝමාලියාවේ දී අත්විඳින්නට සිදුවූ කරුණුවලින් පසුව සාම සාධනය පිළිබඳව අනතුරු ඇඟවීම සමාලෝචනයට භාජනය කර ඇත. එහිදී සාමය ගොඩනැංවීම සඳහා වූ වැඩි ශක්‍යතාවක් සහ වඩාත් සවිමත් ප්‍රවේශයක් එකතු කිරීමට බලාපොරොත්තු වන්නා වූ නව දර්ශනයකට අනුකූලතාවක් දක්වා ඇත.

ගැටුම් කළමනාකරණය සඳහා වූ තම වගකීම් ඉටු කිරීමට සාම සාධකයින් උත්සාහ කරන අවස්ථාවේ දී ගැටුම් නිරාකරණ පර්යේෂණවල දී ලද දැනුම ඔවුන්ට අදාළ විය හැකි බව පෙන්වාදීම මෙම පරිච්ඡේදයේ ප්‍රධාන අරමුණ වන්නේය. මෑතක දී ඉදිරිපත් වී ඇති විවේචනවලට සහ සාම සාධනය හා ගැටුම් නිරාකරණය අතර සමීප සම්බන්ධතාවක අවශ්‍යතාව ගැන වූ මූලික පාඩම් කිහිපයක් පිළිබඳව පළ වූ අදහස්වලට ප්‍රතිචාර වශයෙන් සාම සාධක ප්‍රතිපත්තිය ගොඩනැගෙන්නේ කෙසේද යන්න එය තවදුරටත් පෙන්වා දෙයි. සාම සාධන මෙහෙයුම්වල දී බලය පාවිච්චි කළ යුතු ද එසේ නම් ඒකවර ප්‍රමාණයකටද යන්න පිළිබඳව වාදයක ඍජුව නියැලෙනවාට වඩා සාම සාධන සංකල්ප ගොඩනැගීමට සහ ව්‍යවහාරයේ දී ඒවා භාවිත කිරීමට ගැටුම් නිරාකරණ න්‍යායයට කළ හැකි දායකත්වය ගැන මෙම පත්‍රිකාව අවධානය යොමු කරනු ඇත.

සාම සාධනය දීර්ඝ කාලයක් තිස්සේ සලකනු ලබන්නේ ගැටුම් කළමනාකරණයේ මෙවලමක් ලෙසිනි. එහෙත් සාමාන්‍යයෙන් ගැටුම්වලට පදනම් වූ හේතුවලට අවධානය යොමු නොකිරීම හේතුවෙන් අවාසනාවකට මෙන් එය දෝෂ සහිතය. කෙසේ වුවද ගැටුම් නිරාකරණයේ මෙවලමක් වශයෙන් අපි

එහි ශක්‍යතාවය කෙරෙහි අවදානය යොමු කරන්නෙමු. එසේ කිරීමේ දී අරමුණු දෙකක් කෙරෙහි අවධානය යොමු කෙරෙනවා ඇත. එක් අතකින් ප්‍රචණ්ඩත්වය පැතිරීම වැළැක්වීම සහ අනෙක් අතින් සාමය ගොඩනැංවීමේ ප්‍රයත්නය එම කරුණු දෙකයි. වසර ගණනාවක් තිස්සේ විවිධ සංවිධාන මගින් ඇත්ත වශයෙන්ම සාම සාධක කටයුතු ක්‍රියාත්මක කර ඇති බව අප පිළිගන්නා අතර මෙම පරිච්ඡේදයේ කේන්ද්‍රගත වන්නේ එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතුයි. එහි දී තර්කය වන්නේ මෙහි ගවේෂණයට ලක් වී ඇති අංශ බොහොමයක් අනිකුත් සංවිධානවල සාම සාධක ප්‍රයත්නයන්ට ද පැහැදිලිවම අදාළ වීමයි.

පළමුවැනි කොටස මේ අවදියේ ක්‍රියාත්මක වන සාම සාධන කටයුතුවල සීමාවන් සලකුණු කරයි. දෙවන කොටස සාම සාධන ක්‍රියාකාරීත්වය සඳහා ගැටුම් පර්යේෂණ සහ න්‍යාය ගොඩනැංවීමේ වැදගත්කම ගැන විස්තර වශයෙන් පැහැදිලි කරයි. සන්දර්භ තුනක් තුළ මෙය තවදුරටත් ගවේෂණය කෙරෙනවා ඇතඃ

- ගැටුම් විශ්ලේෂණය සහ මැදිහත්වීමේ රාමුව ස්ථාපනය කිරීම සඳහා එහි අදාළත්වය;
- කාල රාමු වෙනස් කිරීම සහ ප්‍රචණ්ඩ ගැටුම් කළමනාකරණයේ දී මේ කරුණු වෙනස් කොට හඳුනාගැනීමේ වැදගත්කම; විශේෂයෙන්ම ශක්තිමත් සාම සාධන කාර්යයන් පිළිබඳ නවතම සාකච්ඡාවලට අදාළව මෙය සලකා බැලේ.
- නූතන සාම සාධක මෙහෙවර සඳහා අවශ්‍ය වන විශේෂිත නිපුණතා සහ පුහුණුව. මෙහි දී විශේෂයෙන්ම ගැටුම් නිරාකරණයේ දායකත්වය කෙරෙහි අවධානය යොමු විය යුතුය.

මෙම කොටස සමාප්ත වන්නේ සාම සාධනයේ දී ගැටුම් නිරාකරණ න්‍යාය භාවිත කිරීම පිළිබඳ දෘෂ්ටීන් සහ උදාහරණ පිළිබඳ සාකච්ඡාවකිනි. අවසාන කොටස අනාගත ප්‍රමුඛතා සහ අවශ්‍යතා සාකච්ඡා කරයි. එය අවසන් කරනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ සාම සාධන හැකියාව ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන්නාවූ අලුත්ම ප්‍රයත්නයන් සැලකිල්ලට ගනිමින් සාම සාධන කාර්යයයේ අනාගතය ගැන මත ප්‍රකාශ කරමිනි.

2. සාම සාධනයේ පරිණාමය සහ වර්ධනය

2.1. සාම සාධනයේ වර්ධනය 1956-1988

සාම සාධනය යනුවෙන් නිශ්චිත ආකාරයෙන් නම් කරන ලද පළමු මෙහෙවර වූයේ UNEFI හෙවත් එක්සත් ජාතීන්ගේ හදිසි බලකායයි (එ.ජා.හ.බ). 1956 සූවස් අර්බුදයට ප්‍රතිචාරයක් වශයෙන් එම හදිසි බලකාය සිනායි අර්ධද්වීපයට පිටත් කර හරින ලදී. එසේ යවන ලද්දේ සටන් විරාමය සහ ඊජිප්තුවට අයිති ප්‍රදේශයෙන් බ්‍රිතාන්‍ය, ප්‍රංශ සහ ඊශ්‍රායල් හමුදා ඉවත්වීම නිරීක්ෂණය කිරීම සඳහාය. එක්සත් ජාතීන්ගේ ප්‍රථම සන්නද්ධ සාම සාධන මෙහෙයුම වශයෙන් එක්සත් ජාතීන්ගේ හදිසි බලකාය (UNEFI) එක්සත් ජාතීන්ගේ අනිකුත් මෙහෙවර සඳහා වැදගත් පූර්වාදර්ශයකි. තවදුරටත් එය ගැටුම් මැඩ පැවැත්වීමේ දී සන්නද්ධ සහ මධ්‍යස්ථ බලකායන් විසින් ඉටු කළ හැකි කාර්යභාරයේ අගය සලකා බැලීම සඳහා පිරික්සුම් ප්‍රත්‍යයකයක් බවට පත්විය. පැවරුණා වූ වගකීම සපුරා ගැනීමේ දී මෙහෙවර

සාර්ථක විය. ඒ අනුව එය අනාගත මෙහෙවර සඳහා වටිනා ආදර්ශ වශයෙන් යොදාගත් ප්‍රතිපත්ති මාලාවක් ස්ථාපිත කළේ ය. මහ ලේකම් ඩැග් හැමර්ෂල්ඩ් සහ මහා මණ්ඩලයේ සභාපති ලෙස්ටර් පියර්සන් යන අය මෙම ප්‍රතිපත්ති හඳුනාගත්හ. ඒවා මෙසේ ය:

- මෙහෙවර සඳහා ආරාවුලට සම්බන්ධ *පාර්ශවයන්ගේ එකඟත්වය;*
- ආත්ම ආරක්ෂාව සඳහා හැරෙන්නට *බලය පාවිච්චි නොකිරීම;*
- කුඩා සහ මධ්‍යස්ථ රටවල හට කණ්ඩායම් හමුදා බලකායට සහභාගී වීම සඳහා *ස්වේච්ඡාවෙන් දායකවීම;*
- *අපක්ෂපාතී බව*
- මහ ලේකම් විසින් *සාම සාධක මෙහෙයුම් පාලනය කිරීම*

මේ ප්‍රතිපත්ති අතුරෙන් එකඟතාව, අපක්ෂපාතී බව සහ බලය පාවිච්චි නොකිරීම යන කරුණු සාම සාධන කාර්යයයේ ප්‍රධානතම මූලධර්ම තුන වශයෙන් සඳහන් කරනු ලැබේ. මෙම ප්‍රතිපත්ති ගණනාවක් විශේෂයෙන්ම පශ්චාත් සීත යුද්ධ ගැටුම් අවදියේ සාම සාධනය භාවිත කිරීම සම්බන්ධ විවාදයේ දී විරෝධයට සහ අභියෝගයට ලක් වී ඇති නමුත් ඒවා අද ක්‍රියාත්මක වන සාම සාධනයේ හරය තවමත් නිර්වචනය කරයි.

සීතල යුද්ධ සමයේ දී සමස්තයක් වශයෙන් සාම සාධක මෙහෙයුම් 13 ක් ක්‍රියාත්මක කරන ලදී. අවස්ථා කිපයක් හැරෙන්නට මේ කාලයේදී ක්‍රියාත්මක වූ මෙහෙවරයන් වැඩි වශයෙන් ක්‍රියාත්මක කරන ලද්දේ රාජ්‍ය අතර ගැටුම් සම්බන්ධයෙනි. ඒවායේ එකම කාර්යය වූයේ යුද විරාම ගිවිසුම්වලින් පසුව දේශ සීමා නිරීක්ෂණය කිරීම සහ යුධ මුක්ත කලාපයන් ස්ථාපිත කිරීමයි. මෙහෙවරවල් සමන්විත වූයේ එක්සත් ජාතීන්ගේ කුඩා හා මැදිහත් සාමාජික රටවල සැහැල්ලු ආයුධවලින් සමන්විත ජාතික හමුදා කාණ්ඩයන්ගෙනි.

2.2. එක් දහස් නවසිය අනූ ගණන්වල පශ්චාත් සීතල-යුද සාම සාධනය

1980 ගණන්වල අග භාගයේ සිට 1994 දක්වා ලෝකය පුරා ක්‍රියාත්මක කරන ලද සාම සාධන මෙහෙයුම් සංඛ්‍යාව විශාල වශයෙන් වර්ධනය විය. 1988 ආරම්භයේ සීතල යුද්ධය අවසාන කරා ළං වෙමින් තිබෙන අවධියේ දී ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වෙමින් පැවතුණේ මෙහෙයුම් පහක් පමණි. තුනක් මැද පෙරදිග විය. කාශ්මීරයේ කුඩා නිරීක්ෂණ මෙහෙවරක් හා සයිප්‍රසයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවක් විය. 1988 සහ 1996 අතර මෙහෙයුම් 29 ක් ඇති කරන ලදී. එය සංසන්දනය කළ යුත්තේ 1948 න් 1887 කාලය ඇතුළත ක්‍රියාත්මක කරන ලද මෙහෙයුම් 13 ක් සහ 1979 සහ 1988 අතර දශකයේ දී මෙහෙයුම් කිසිවක් නැති තත්ත්වය සමඟය.

කොටුව 1:
එක්සත් ජාතීන්ගේ සාම සාධනයේ වර්ධනය 1988- 2000

	1988	1992	1994	2000
සක්‍රීය මෙහෙවර සංඛ්‍යාව	5	11	17	14
හමුදාවලින් දායක වන රටවල්	26	56	76	89
යුද හමුදාමය භට පිරිස්	9570	11,495	73393	30350
සිවිල් පොලිස් භට පිරිස්	35	155	2130	7038
ජාත්‍යන්තර සිවිල් පුද්ගලයන්	1516	2206	2260	3243
වාර්ෂික එක්සත් ජාතීන්ගේ අයවැය	ඩොලර් මිලියන 230.4	ඩොලර් මිලියන 1689.6	ඩොලර් මිලියන 3610	ඩොලර් මිලියන 2,220

සාම සාධක මෙහෙයුම්වල මෙම පැහැදිලි වර්ධනය කැටුව යන මූලික වෙනස්කමක් වන්නේ ඒවායේ ස්වභාවයයි. නැතිනම් වඩාත් පැහැදිලිව සඳහන් කරන්නේ නම් ඒවායේ *කාර්යභාරය* සහ *සංයුතියයි.* සාම්ප්‍රදායික මෙහෙයුම් හා බැඳී තිබූ තනි කාර්යභාරය බහුවිධ කාර්ය ගොන්නක් දක්වා වර්ධනය වී තිබේ. ඒ අතරම පශ්චාත් සීතල යුද්ධ සාම සාධක මෙහෙයුම්වල සංයුතිය වඩාත් විවිධ සහ සංකීර්ණ වී තිබේ. සාම සාධක කාර්යයේ යෙදෙන අයවලුන් බඳවාගෙන ඇත්තේ පුළුල් වූ විවිධ රැකියාවල යෙදෙන (හමුදා, සිවිල්, පොලිස් සහ තානාපති සේවය) මෙන්ම විවිධ ජාතීන්ට හා සංස්කෘතීන්ට අයත් පිරිස් අතුරිනි. නූතන සාම සාධනය දැන් බහු පාර්ශ්වීය, බහුමාපක, බහුජාතික සහ බහු සංස්කෘතික වශයෙන් නිසි ලෙස හඳුන්වා දිය හැකිය.

බහු පාර්ශ්වීය යන්නෙන් හැඟෙන්නේ කිසියම් මෙහෙයුමක් සඳහා තලයන් කිහිපයකට අයත් ක්‍රියාකාරීන්ගේ සහභාගීත්වයයි. මෙම ක්‍රියාකාරීන් ගැටුම්වලට සම්බන්ධ විය හැකි පාර්ශ්වයන්, සහභාගී වන සාම සාධනයේ යෙදී සිටින්නන් මෙන්ම එක්සත් ජාතීන් සහ වෙනත් ජාත්‍යන්තර ක්‍රියාකාරීන් විය හැකිය.

බහුජාතික හා බහුසංස්කෘතික යන පදයන්ගෙන් යෝජනා කරන්නේ සාම සාධක බලකායට විවිධාකාර වූ පරාසයන්ගෙන් සමන්විත ජාතීන් හෝ නියෝජිතායතනවලින් බඳවාගනු ලබන හමුදා සහ සිවිල් කණ්ඩායම් ය. මේ සෑම කණ්ඩායමක්ම තම තමන්ට ආවේණික වන්නාවූ දේශපාලන හා සංස්කෘතික පසුබිම, ගැටුම් තත්ත්වයන් පිළිබඳ තම තමන්ගේ විවිධාකාර අවබෝධය සහ ගැටුම් නිරාකරණය කිරීම සඳහා වූ විවිධ ප්‍රවේශයන් හා විධික්‍රම මෙහෙයුමට ඒකාබද්ධ කර ගනිති. සීතල යුද්ධ අවසානයේ දී (1989, පෙබරවාරි) ස්ථාපනය කරන ලද එවන් පළමු බහුමානක මෙහෙයුම වූයේ නැමීබියාවේ එක්සත් ජාතීන්ගේ සංක්‍රාන්තික ආධාර කණ්ඩායමයි (UNTAG). කම්බෝජයේ, සෝමාලියාවේ සහ කලින් තිබූ යුගොස්ලෝවියාවේ මහා පරිමාණයෙන් මෙහෙයුම් දියත් වීමක්, ඊට පසුව, 1992 දී සිදු විය.

මෙම මෙහෙයුම් බහුමානක වන අතර එයට හමුදාව සිවිල් පොලීසිය සහ වෙනත් සිවිල් කොටස් එකතු කරගනු ලැබේ. ඒ සියලු කොටස් තම තමන්ගේ නිශ්චිත කාර්යභාරයන් ඉටු කරයි (කොටුව 2 බලන්න). හමුදා කොටස්, එනම් එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් දායක වූ ගොඩබිම්, නාවික සහ ගුවන් යන හමුදා, සන්නද්ධ සහ සන්නද්ධ නොවන භටයන්ගෙන් සමන්විත වේ; එයින් දෙවනුව සඳහන් කරන ලද කණ්ඩායම නිතරම හැඳින්වෙන්නේ හමුදා නිරීක්ෂකයන් යනුවෙනි. අවශ්‍යයෙන්ම හමුදා කොටසේ කාර්යභාරය වන්නේ සහායක භූමිකාවක සේවය කිරීමයි. සිවිල් කොටස්වලට තම කාර්යයන් කරගෙනයාමට හැකිවන පරිදි ආරක්ෂා සහිත පරිසරයක් තහවුරු කිරීම සහ පවත්වාගෙන යාම එම කාර්යභාරයයි. සාම සාධක මෙහෙයුම්වල දී සිවිල් පොලිස් අංශය ද අතිශයින් වැදගත් කොටස්කරුවෝ වෙති. ඔවුන්ගේ කාර්යභාරය සිවිල් හා හමුදාමය ක්‍රියාකාරීන් අතර පවතින එකකි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අධිකාරිය යටතේ මෙහෙයුම්වල යෙදෙන්නාවූ ජාත්‍යන්තර පොලිස් අධීක්ෂකයෝ ආරක්ෂා සහිත පරිසරයක් ඇති කිරීමෙහි සහ මහජන විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් උදව් වෙති. අවසාන වශයෙන් සමහරවිට හමුදා කොටස ඉක්මවන තරම් සෑහෙන විශාල සිවිල් ජන කොටසක් ද වේ. මේ කොටස ප්‍රධාන කණ්ඩායම් දෙකකින් සමන්විතය. පළමුවෙන්ම අන්තර් රාජ්‍ය සංවිධාන (IGO) හෙවත් රාජ්‍යයන් දෙකක් හෝ කිහිපයක් එළඹගත් ගිවිසුම් මගින් වරම් ලැබූ සංවිධාන තිබේ. සියලු එක්සත් ජාතීන්ගේ ආයතන, අප්‍රිකානු සංගමය වැනි කලාපීය සංවිධාන හෝ යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගතාව සඳහා වූ සංවිධානය (OSCE) සහ ජාත්‍යන්තර රතු කුරුස / රතු අඩසඳ කමිටුව (ICRC) යන සංවිධාන මෙයට අයත් වේ. දෙවනුව රාජ්‍ය නොවන සංවිධාන සහ ගොඩනගන ලද රටේ ආණ්ඩුවෙන් බැහැරව සංස්ථාපනය කර ඇති ජාතික හා ජාත්‍යන්තර සංවිධානයි.

කොටුව 2 බහුමාන සාම සාධන මෙහෙයුම්වල කාර්යභාර

සංරචකය	කෘත්‍යය
හමුදාමය සංරචකය	■ සටන් විරාම අධීක්ෂණය සහ හරි වැරැදි බැලීම ■ හමුදා කඳවුර ■ සටන්කරුවන් නිරායුද කිරීම සහ හමුදාවෙන් මුදාහැරීම ■ විදේශ හමුදා ඉවත් කර ගැනීම අධීක්ෂණය ■ බිම් බෝම්බ පිළිබඳ දැනුවත් කිරීමේ අධ්‍යාපනය සහ බිම් බෝම්බ ඉවත් කිරීම ■ සාම ක්‍රියාවලියට සහයෝගයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සහ අනිකුත් ජාත්‍යන්තර ක්‍රියාකාරකම්වලට ආරක්ෂාව සැපයීම
සිවිල් පොලිස් සංරචකය	■ පිරිස් පාලනය ■ අධිකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම ■ නීතිය බලාත්මක කිරීම ■ සංවිධාන, පරිපාලන සහ මානව හිමිකම් කරුණු පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය බලධාරීන් අධීක්ෂණය කිරීම, පුහුණු කිරීම සහ ඔවුන්ට උපදෙස් දීම
සිවිල් සංරචකය	දේශපාලන මූලාංගය : ■ සමස්ත සාම ක්‍රියාවලියට දේශපාලන මගපෙන්වීම

සංරචකය	කෘත්‍යය
	■ පවත්නා දේශපාලන ආයතන පුනරුත්ථාපනය කිරීමට සහයෝගය ලබාදීම ■ ජාතික ප්‍රතිසංධානගත වීම් වර්ධනය කිරීම මැතිවරණ මූලාංගය : ■ මැතිවරණ ක්‍රියාවලියේ සෑම අංශයක්ම සෑම අවස්ථාවකදීම අධීක්ෂණය කිරීම සහ හරි වැරැදි සසඳ බැලීම. ශිල්පීය සහාය සම්බන්ධීකරණය කිරීම. ■ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව මහජනයාට අධ්‍යාපනය ලබාදීම සහ බිම් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සංවර්ධනය කිරීම. මානව හිමිකම් මූලිකාංගය : ■ මානව හිමිකම් අධීක්‍ෂණය ■ විශේෂිත මානව හිමිකම් උල්ලංඝන සංසිද්ධි ගවේෂණය ■ මානව හිමිකම් ප්‍රවර්ධනය මානුෂවාදී මූලිකාංගය : ■ මානුෂ ආධාර සැපයුම (ආහාර හා වෙනත් හදිසි ආධාර) ■ සරණාගතයින් සියරට යැවීම ක්‍රියාත්මක කිරීම ■ විස්ථාපිත පුද්ගලයින් යළි පදිංචි කරවීම ■ හමුදා විමුක්තිකයන් යළි ඒකාබද්ධ කර ගැනීම

කලහකාරීන් මත එල්ල කර හැකි ප්‍රබල බලපෑම මගින් ශක්තිය ලබාගන්නා හමුදා සංරචකය මෙන් නොව සිවිල් කොටසේ බල පදනම විය හැක්කේ රාජ්‍ය තාන්ත්‍රික, ආර්ථික, න්‍යායාත්මක, විද්‍යාත්මක සහ තාක්‍ෂණික, මානුෂවාදී, නීතිමය පදනමක් හෝ මේවායේ සංකලනයකි. ක්‍රියාත්මක කරන ලද විවිධ ක්‍රියාවන් සහ පැවරුම් සම්බන්ධයෙන් ගත් කල සිවිල් කොටස උප කොටස් හෝ මූලයන් හතරක් වන පරිදි තවදුරටත් බෙදිය හැකිය. එනම් දේශපාලන, මැතිවරණ, මානව හිමිකම් සහ මානුෂවාදී ලෙසිනි.

1988 පසුව ක්‍රියාත්මක කරන ලද මෙහෙවර ඒවා ක්‍රියාත්මක විය යුතු මූලධර්ම පැහැදිලි කරන හමුදා න්‍යායයන්ට අනුව යළි නිර්වචනය කෙරිණි. ඒවා දැන් 'බහුමානක මෙහෙයුම්' ලෙසත් 'දෙවැනි පරම්පරාවේ සාම සාධක මෙහෙයුම්' ලෙසත් 'පුළුල් සාම සාධනය' ලෙසත් එසේත් නැත්නම් දෙවන පරම්පරාවේ 'බහුමානක හමුදා බලකාය' ලෙසත් විවිධාකාර ලෙස විස්තර කෙරේ.

3. සාම-සාධන කාර්යයට ඇති නව අභියෝග

ආරම්භක සාම සාධක මෙහෙයුම් දියත් කිරීමේ ගෞරවයට පාත්‍ර වූ පුද්ගලයන් දෙදෙනෙකුට වෙන් වෙන් වශයෙන් නොබෙල් සාම ත්‍යාග පිරිනමනු ලැබීය. ඔවුහු නම් 1957 දී ලෙස්ටර් පියර්සන් සහ අභාවයෙන් පසු 1961 දී ඩැග් හැමර්ෂල් යන අය වෙති. 1988 දී එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවලට ත්‍යාගය පොදුවේ පිරිනමන ලදී. එසේ වුවත් 1990 ගණන්වලදී එක්සත් ජාතීන්ගේ ප්‍රතිරූපය

විශේෂයෙන්ම එහි සාම සාධක අංශය පෙනී ගොස් තිබෙන්නේ එතරම් ධනාත්මක හැඟීම් දනවන අයුරකින් නොවේ.

නව කාර්යයන්ට සහ අභියෝගවලට යෝග්‍ය වන පරිදි සකසා ගලපා ගැනීමට ප්‍රයත්න දරනවාත් සමග මෑත වසරවලදී සාම සාධන කටයුතු විවිධාංගීකරණය වී තිබෙන අතරතුර සාම සාධක මෙහෙවර ක්‍රියාත්මක කරනු ලබන්නා වූ සන්දර්භ හා පරිසර ද වඩාත් සංකීර්ණය වී තිබේ. කොංගෝවේ ඕඑන් යූ සී (ONUC) සහ ලෙබනනයේ යූ එන් අයි එෆ් අයි එල් (UNIFIL) මෙන් ව්‍යතිරේකයන් තිබුණේ වී නමුදු 1990 ගණන්වලට පෙරාතුව සංවිධානය කරන ලද බොහෝ සාම සාධක මෙහෙයුම් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වූයේ අවසර ඇති පරිසරයන්හි දීය. එම අවස්ථාවේදී ඔවුන්ට රැඳී සිටීමට සත්කාරක ආණ්ඩුවල අනුමතය සහ සහයෝගය ලැබුණි. 1990 ගණන්වල දී මෙහෙවර වැඩි වැඩියෙන් ක්‍රියාත්මක කරන ලද්දේ අභ්‍යන්තර යුද තත්ත්වයන් යටතේ හෝ සංකීර්ණ දේශපාලන හදිසි අවස්ථා සෙවණැලි යටතේ ය. මෙම තත්ත්වය සිවිල් සහ අභ්‍යන්තර යුද තත්ත්වයන් වශයෙන් ද නිර්වචනය කළ හැකිය. මෙවැනි අවස්ථාවල දී එක්සත් ජාතීන්ට නිරතුරුවම ක්‍රියා කිරීමට බල කෙරුණේ නීති නොතකන්නාවූ සහ ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් යටතේ ය. මෙම අවස්ථාවන්හි දී සටන්කාමී සහ අර්ධ හමුදා කණ්ඩායම් ස්වාධීන ආකාරයෙන් ක්‍රියා කරති. මෙහිදී අනුමතය අර්ධ වශයෙන් විය හැකි අතර එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන බෝහෝවිට ගැටුම්වලටත් විරෝධයන්ටත් ලක් වේ.

පොදුවේ රට අභ්‍යන්තරයේ ඇතිවන යුද්ධය නිසා සහ අතිශය ප්‍රචණ්ඩ වූ සිවිල් ගැටුම්වල බලපෑම හේතු කොට ගෙන ඉදිරිපත් වන්නා වූ අභියෝග සාම සාධන ක්‍රියාවලි පිළිබඳව ලැබී ඇති උපකල්පනයන් බොහොමයක්ම විවිධාකාරයෙන් ප්‍රශ්න කිරීමට ලක් කොට තිබේ. පශ්චාත් සීතල යුද්ධ කාල පරිච්ඡේදය තුළ සිදුවූ ගැටුම් එක්සත් ජාතීන්ගේ හැකියාවන්වල සීමාවන් දක්වාම පිරික්සුමට භාජනය කොට ඇත. සෝමාලියා, රුවන්ඩා සහ බොස්නියා යන රටවලදී අත් වූ අසාර්ථකත්වයන් හේතු කොට ගෙන එම මෙහෙයුම් ශාස්ත්‍රීය ලියකියවිලි තුළ හෙළා දැක්මේ තක්සේරුවකට ලක්විය.

දශකය අවසානයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානයම සිද්ධීන් දෙකක් පිළිබඳව පරීක්ෂණ වාර්තා ප්‍රකාශයට පත් කළේය. එම සිද්ධීන් ගැටුම් නිරාකරණය කිරීමේ ප්‍රයත්නයන්හි දී ලත් අත්දැකීම්, සම්බන්ධ පහත්ම අවස්ථාව බවට සටහන් විය (United Nations 1999 a, United Nations 1999). 1994 අප්‍රියෙල් සහ ජුලි මාසවලදී රුවන්ඩාවේ වැසියන් දළ වශයෙන් 800,000 මරා දැමුවා වූ සමූල ඝාතනය විස්තර කර ඇත්තේ "විසිවන ශත වර්ෂවේ සිදුවූ අතිශයින්ම පිළිකුල් සහගත සිද්ධියක්" වශයෙනි. අවුරුද්දක් ගෙවුණු තැන දෙවන ලෝක මහා යුද්ධයේ අවසානයෙන් පසු යුරෝපයේ කරන ලද දරුණුතම යුද අපරාධවලින් එකක් වූයේ ආරක්ෂක මණ්ඩල යෝජනා 819 (16 අප්‍රියෙල් 1993) යටතේ ලෝකයේ පළමු වරට සිවිල් ආරක්ෂක ප්‍රදේශයක් වශයෙන් නම් කර තිබූ ස්‍රෙබ්‍රනිකා නම් බොස්නියානු මුස්ලිම් නගරය සර්බියානු භට කණ්ඩායම් මගින් වටලෑමයි. මෙම වටලෑමේදී එහි රඳවා සිටි එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා බළඹයේ දැස් ඉදිරි පිටම 8000 ක් මුස්ලිම් ජාතිකයන් මරා දමන ලදී.

මිනී මැරීම, පළවා හැරීම හෝ සමස්ත ජනසංඛ්‍යාවක් බිය වැද්දීම සඳහා වර්ධනය වන ප්‍රයත්නය හමුවේ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථ, අපක්ෂපාතී සහ මැදිහත්වීමේ කාර්යභාරය ඛේදජනක අන්දමින් නොසෑහෙන බව ඔප්පු වන බව වාර්තා දෙකම අවසාන වශයෙන් නිගමනය කර තිබුණි. ඊට

අමතරව පළමුව ඉල්ලීම වූයේ විවිධාකාර ගැටුම්වලට ප්‍රතිචාර දැක්වීමට එක්සත් ජාතීන්ට ඇති හැකියාව වඩාත් හොඳින් පැහැදිලි කර දීමට සහ වැඩි දියුණු කිරීමේ ප්‍රත්‍යක්ෂණ ක්‍රියාවලියක් සඳහා ද දෙවැනුව "මෙම ශත වර්ෂය අවසානයේ සාම සාධක කාර්යයේ අඩුපාඩු විසඳගෙන ඊළඟ ශත වර්ෂයේ අභියෝගවලට මුහුණ දීම" (United Nations 1999 b, 81) සඳහා ද ඉල්ලීමක් විය.

කෙටියෙන් සඳහන් කරන්නේ නම්, අද සාම සාධක කාර්යය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය රැඳී පවතින්නේ අර්ධ වශයෙන් අනුමත හෝ කැමැත්තකින් තොර පරිසරයක නව සාම සාධක ප්‍රයත්නයන් නියමාකාරයෙන් ක්‍රියාත්මක විය යුතු විශේෂිත ආකාරයන් පැහැදිලි කරදෙන සංකල්පයක් ගොඩනගා ගැනීම තුළ යැයි තර්ක කිරීම අසාධාරණ බව පෙනේ. 1988 සිට බොහෝ අවස්ථාවල දී මෙහෙයුම්වල යෙදෙන්නට සිදුවූයේ එවැනි පරිසරයක් තුළය. සංකල්පය ප්‍රායෝගික බවට පත්කොට ක්‍රියාත්මක කිරීම සඳහා වූ විශේෂිත යෝජනා ද මෙහි ඇතුළත් විය යුතුය.

4. සාම සාධන කාර්යයෙහි නව වර්ධන

එක්සත් ජාතීන්ගේ සාම සාධන කාර්යයේ අත්දැකීම් මගින් ඇති වී තිබෙන කළකිරීම 1994 දී ඉහළම මට්ටමේ පැවති හමුදා යෙදවීම් සංඛ්‍යාවේ පැහැදිලි අඩුවීමකට මඟ පෑදීය (කොටුව 1 බලන්න). බොහෝ නිරීක්ෂකයෝ ඊටත් වඩා දුර ගොස් ක්‍රියාමාර්ගයක් වශයෙන් සාම සාධක කටයුතු කිරීම අත්හැර දමන මෙන් ඉල්ලා ඇත. 1988 දී වර්ෂයට පෙර කාලයේ දී අනුගමනය කළ සීමිත සහ ගතානුගතික ක්‍රම ඔවුන් අනුමත කරන අතර එම ක්‍රම කලාපීය සහ මහ බලවතුන්ගේ ගැටුම් කළමනාකරණ ක්‍රමවලට අනුකූලතාවයක් පෙන්වයි. සාම සාධනය පිළිබඳව විවේචනාත්මකව ලිපි සෑහෙන ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇත. උදාහරණයක් වශයෙන් රිචර්ඩ් බෙට්ස් (1994) ඩේවිඩ් රීෆ් (1994) සහ එඩ්වඩ් ලුට්වැක් (1999) වැනි අයගේ ලේඛන සඳහන් කළ හැකිය.

අනික් අතට, ගැටුම්වලින් ඇතිවන අවාසනාවන්ත තත්ත්වය අඩු කිරීමට සහ ඒවා නැති කිරීමට පවා දේශපාලන හමුදාමය සහ මානුෂීය කාර්යයන් ඒකාබද්ධ කිරීමේ හැකියාව සතුව පවතින ආයතනය එක්සත් ජාතීන් පමණක් බවට තවමත් තර්ක කරන අය සිටිති. සාම සාධකයේ ක්‍රියාත්මක සහ සංකල්පීය දුර්වලතාවන් නිවැරදි කිරීම සඳහා මැදිහත්වීමේ සාම සාධක පිළිවෙල වර්ධනය කිරීමේ සහ සංශෝධනය කිරීමේ පරිශ්‍රමයන් අවශ්‍ය යැයි මෙම විශේෂඥයෝ කියා සිටිති. පොදුවේ ගත් කල මෙම පරිච්ඡේදයෙන් යෝජනා කරන ක්‍රියාමාර්ගය මෙයම වන්නේය. ප්‍රතිසංස්කරණ සඳහා තෝරාගත් නව වර්ධන, නවතම ප්‍රවේශ සහ යෝජනා පසුව එන ඡේදයන් දී ගවේෂණයට ලක් කරනවා ඇත.

පළමු වන කොටුවෙන් පෙනෙන පරිදි වඩාත් මෑතක දී ක්‍රියාත්මක කරන ලද මෙහෙයවරයන්හිදී සිවිල් සහ සිවිල් පොලිස් කොටස් සැලකිය යුතු ආකාරයෙන් වර්ධනය වී ඇත. දැනට යොදවා ඇති මිලිටරි හමුදාවල සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා එයට ඇතුළත් වී තිබේ. මෑත සාම සාධන මෙහෙවරවල දී ද මිලිටරි දායකත්වය සංඛ්‍යාත්මකව මෙන් ම යොදවා ඇති සිවිල් පුද්ගලයන්ගේ සහ සිවිල් පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාවට සංසන්දනාත්මකව බලන කල අඩු වී ඇති අතරම, අනාගතයේදී සාම සාධනය වඩාත් ශක්තිමත් කාර්යභාරයක් ඉටු කිරීමට ඉඩ සැලසෙන ආකාරයෙන් සාම සාධන මතවාදය වර්ධනය වී ඇත.

මෙහි අරමුණ වන්නේ සිවිල් ජනතාව ආරක්ෂා කිරීමට අසමත්වීම වැළැක්වීම (බොස්නියාවේ දී සහ රුවන්ඩාවේ දී සිදුවූවාක් මෙන්) සහ සාම සාධක හමුදාවනට එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලවලට සෑහෙන ප්‍රමාණයක ආරක්ෂක යාන්ත්‍රණ තිබෙන බවට සහතික වීමත් ය (සියරා ලියෝන් සහ බටහිර ටිමෝරයේ වැනි තත්ත්වයන් හෝ පාඩම් ඉගෙන ගැනීම, එහිදී එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය කලහකාරීන් සහ සටන්කාමීන් විසින් පැහැර ගෙන ගොස් මරා දමන ලදී). සාම සාධක සිද්ධාන්තයේ විස්ථාපනයක් සඳහා මූල පුරන ලද්දේ 1990 ගණන්වලදී මහා පරිමාණ යෙදවුම්වලට සහභාගී වූ රටවල ජාතික ආරක්ෂක ආයතන විසිනි. ප්‍රමාණවත් සූදානමකින් හා සහායකින් තොරව ගැටුම් මැදට ඔවුන්ගේ හමුදා යැවීමට ඔවුන් තවදුරටත් එකඟ නොවනු ඇත. මෙම නව චින්තන ක්‍රමය වඩාත් නිදර්ශනාත්මකව පැහැදිලි කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය සාම සාධක මතය මගිනි.

මෙම නවතම සාම සාධන ආකෘතිය බ්‍රිතාන්‍ය මිලිටරිය විසින් හඳුන්වනු ලබන්නේ ‘සාම සහායක මෙහෙයුම්’ වශයෙනි (PSO). මෙම පදය සාමාන්‍යයෙන් භාවිත කරනු ලබන්නේ පුළුල් පරාසයකට අයත් අනාගත මෙහෙයුම් හඳුන්වන්නට ය. එය ගැටුම් වැළැක්වීමේ සිට සාම සාධනය දක්වා පැතිරෙන අතර පශ්චාත් සීතල යුද්ධ භූ - උපාය මාර්ග පරිසරයට ගැලපෙන මකයක් ද සපයනවා ඇත. මෙම විෂයය පිළිබඳ න්‍යායාචාර්යවරයෙකු වන විල්කින්සන් (2000) ප්‍රකාශ කර ඇති පරිදි සිවිල් යුද්ධ, බිඳවැටී ඇති රාජ්‍යයන් සහ ජාත්‍යන්තර සහ මානුෂීය නීතියට තිබෙන ගෞරවය අඩු වී යාම ආදියෙන් පිරුණු ලෝකයක සාම සාධනය සම්බන්ධයෙන් පවතින සාම්ප්‍රදායික මත යල්පැන ගොස් ඇත. එබැවින් 1990 ගණන්වලදී සකස් කරන ලද සාම සාධන සංකල්ප කාලානුරූප කිරීම අවශ්‍ය වී තිබේ.

ගොඩනැගෙමින් පවතින සාම සාධන සිද්ධාන්ත තුළ සාමය ක්‍රියාත්මක කිරීමේ කාර්යය විශේෂිත අන්දමින් නැවත නිර්වචනය කර ඇති අතර මැදිහත්වීමේ විකල්පයන් පිළිබඳ පුළුල් වූ පරාසය තුළ එයට වඩාත් විශාල තැනක් වෙන් කර ඇත. කෙසේ වුව ද අනුමැතිය සහ සාමය ගොඩනැගීම (මිලිටරි ජයග්‍රහණ නොව) අවසාන අරමුණ වශයෙන් පවතී. සාම සාධනය සහ සාමය ක්‍රියාත්මක කිරීම අපක්ෂපාතී රේඛාවේ ‘හරි’ පැත්තේ සිට ක්‍රියාත්මක වෙමින් තීරණාත්මක ප්‍රභේදය පවතින්නේ සාමය ක්‍රියාත්මක කිරීම සහ යුද්ධය අතරය. ඒ අනුව සාම සාධක ක්‍රියාකාරිකයින් සාමය ගොඩනැගීම පිළිබඳ දීර්ඝකාලීන ඉල්ලීම් සම්බන්ධයෙන් වූ එකඟතාවක් පවත්වාගෙන යාමේ හෝ ප්‍රකෘතිමත් කිරීමේ පරමාර්ථය අවධානයෙන් බැහැර නොකරනු ඇත.

සාමය සඳහා වන සහායේ හරය වශයෙන් නිර්වචනය කරනු ලබන්නේ එකඟතාවට වඩා අපක්ෂපාතීභාවය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවයි. සාම උපකාරක මෙහෙයුම් (PSO) මතය අනුව මෙහෙයුමක් සඳහා හමුදා යෙදවීමට යුද කාමීන්ගේ අනුමැතිය කොන්දේසි විරහිත අවශ්‍යතාවක් නොවේ (ආරක්ෂක අමාත්‍යාංශය 1999). නව මතයේ පරමාර්ථය වන්නේ ප්‍රමාණවත් තරම් නම්‍යශීලී, ශක්තිමත් සහ සටනට සූදානම් සාම සාධක මෙහෙයුම් නිර්මාණය කිරීමයි. ප්‍රචණ්ඩ ක්‍රියා හා තර්ජන මාර්ගයෙන් හෝ ප්‍රදේශයේ ජනතාව සහ ප්‍රදේශයේ ජාත්‍යන්තර ප්‍රජාවට සේවය කරන ජාත්‍යන්තර කාර්යය මණ්ඩලයට තර්ජනය කිරීම මගින් කඩාකප්පල්කාරීන් සාම ක්‍රියාවලිය යටපත් කිරීමට උත්සාහ කිරීම ඇතුළු පුළුල් වූ පරාසයක පිහිටි අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මෙම මෙහෙයුම්වලට හැකිවිය යුතුය (විල්කින්සන් 2000). මෙම සංකල්පය උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය ද (NATO) ඇතුළත්

ජාත්‍යන්තර මිලිටරි ප්‍රජාවේ දිනෙන් දින වැඩිවන කොටසක් විසින් පිළිගෙන ඇත. ඒ නිසාවෙන්ම එය නූතන සාම සාධක මෙහෙයුම් සඳහා මතවාදී පදනම බවට පත් වී තිබේ.

කොසෝවෝහි KFOR හමුදාව යෙදවීම මෙම උපක්‍රමය භාවිත කිරීමේ මුල් අවධියේ උදාහරණයක් වශයෙන් තර්ක කළ හැකිය. නිසැකයෙන්ම 1999 දී නැගෙනහිර ටිමෝරයේ සාම මෙහෙයුම්වලට නායකත්වය දීම සඳහා ඕස්ට්‍රේලියානු හමුදා යෙදවීම තවත් උදාහරණයකි. 2000 ග්‍රීෂ්ම කාලයේදී බ්‍රිතාන්‍ය හමුදා යොදවා සියරා ලියෝන්හි එක්සත් ජාතීන්ගේ හමුදා තර කිරීමත් එවැනිම දෙයකි. මිලිටරි අංශයේ කාර්යභාරය ශක්තිමත් විය යුතු අතරම සීමිත එකක් විය යුතු බව සාම සහායක මෙහෙයුම් මතවාදය (PSO) පිළිගනී. එහි පරමාර්ථය වන්නේ සාමය නැවත ස්ථාපනය කිරීම සඳහා මානුෂවාදී සහ සිවිල් සංවිධානවලට කළ හැකි ආරක්ෂා සහිත ඉඩකඩ නිර්මාණය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීමය.

ජාතික තලයේ පමණක් නොව එක්සත් ජාතීන් තුළත් මෙම වර්ධන දක්නට ලැබී ඇත. තියුණු විවේචන හමුවේ තමන් විසින් "ධනාත්මක පෙළඹවීමක්" යැයි හැඳින් වූ දේ සඳහා සාම සාධක හමුදාවන් තම හැකියාවන් වර්ධනය කර ගැනීමේ හැකියාව කොෆී අනන් යළි යළිත් අවධාරණය කොට ඇත. ඒ ගැටුම් කලාපවල ජනතාව අතර සාම සාධන වරම් සඳහා වැඩිමනත් සහයෝගයක් ලබාගැනීම සඳහාය. වර්තමානයේ දී සාම සාධක හමුදාවන්ට බල කිරීමේ හැකියාවක් අවශ්‍යව ඇතැයි ඔහු තර්ක කරන අතර බලකිරීම් මත පමණක් විශ්වාසය තැබීම ප්‍රමාණවත් නොවන බව ද ඔහු පිළිගනී. බලකිරීමේ ඵලදායී බව කාලයත් සමග ක්ෂය වී යනවා පමණක් නොව බලය යෙදවීමට වඩා බලාපොරොත්තු ඇතිකර වීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් ගැටුම් තත්ත්වයන් තුළ ජීවත්වන ජනතාවගේ හැසිරීම් කෙරෙහි බලපෑමක් කිරීමට උත්සාහ කිරීම ප්‍රතිපත්තියක් වශයෙන් බොහෝ විට වඩාත් යහපත් බවට ඔහු හේතු දක්වයි.

බලකිරීම මගින් අඩු තරමින් ප්‍රචණ්ඩත්වය තාවකාලිකව සීමා කිරීමට හැකි වුවත් අනන්ගේ තර්කය වන්නේ එයට කල්පවතින සාමයක් ලබාදීමට නොහැකි බවයි. කල්පවත්නා සාමයක් සහ දීර්ඝකාලීන විසඳුමක් සඳහා ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම පමණක් නොව 'ඊළඟ පියවර ගැනීම' අවශ්‍ය වේ. අනන් සිතන අන්දමට මෙයින් අදහස් වන්නේ ධනාත්මක දිරිගැන්වීම් හෝ පෙළඹවීම් ඉදිරිපත් කළ යුතු බවයි. වෙනත් වචනවලින් කියන්නේ නම් මෙහෙවර ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ දී ත්‍යාග ප්‍රදානයන් කිරීමට සාම සාධක හමුදාවලට බලය ලබාදිය යුතුය. සාම සාධක මෙහෙයුම්වල අනාගත සාර්ථකත්වය උදෙසා අවශ්‍ය යයි පෙනී යන මෙම සාම සාධක සංකල්පය සාම සාධනය ඍජුවම ගැටුම් නිරාකරණය කිරීමේ විෂය පථය තුළට ගෙන එයි (අනන් 1997, 27-28).

5. ගැටුම් පිළිබඳ පර්යේෂණ සහ න්‍යාය ගොඩනැංවීම: සාම සාධන සඳහා අදාළ බව

ශාස්ත්‍රීය පර්යේෂණ ක්ෂේත්‍රයන් වශයෙන් එක්සත් ජාතීන්ගේ සාම සාධන කාර්යය සහ ගැටුම් නිරාකරණය යන දෙක අතර සංකල්පමය වූ බොහෝ සමානකම් ඇත. එසේම මේ දෙක එකම කාල පරාසයක් තුළ විශේෂිත මාතෘකා ලෙස ඉස්මතු විය. මෑතක සිට න්‍යායවාදීන් සහ ක්‍රියාකාරීන්

යන කොටස් දෙක විසින්ම මෙම ක්ෂේත්‍ර දෙක පටලවා ගෙන උපුටා දැක්වීම වැඩි වී ඇත. ගැටුම් නිරාකරණය පිළිබඳ න්‍යායවාදීන් සාම සාධනය සාධනීය ගැටුම් ව්‍යාවර්තනයක් සඳහා වූ වැදගත් මෙවලමක් වශයෙන් සඳහන් කිරීම වඩා හොඳ තත්ත්වයක් වී ඇති අතර ක්‍රියාකාරී වෘත්තිකයන් කරන්නේ මනෝ විද්‍යාත්මක සහ සන්නිවේදන උපාය මාර්ග මෙන්ම සාම්ප්‍රදායික මිලිටරි බලය යොදා ගැනීමයි. ඒ ආකාරයෙන්ම සාම සාධන ක්‍රියාවලියේ යෙදෙන ක්‍රියාකාරී වෘත්තිකයන්ගේ අලුත්ම විශ්ලේෂණයෙහි තිබෙන වඩාත් කැපී පෙනෙන ලක්ෂණයක් වී ඇත්තේ ගැටුම් නිරාකරණය ක්‍රියාවලියේ විවිධ අංශවල අදාළත්වය ගැන නිතර නිතර සඳහන් කිරීමයි.

සාම සාධන කාර්යය සඳහා ලබාදෙන පුහුණුවේ ස්වභාවය සාම්ප්‍රදායික සටන් පුහුණු ක්‍රමවලින් සැලකිය යුතු තරම් වෙනස් විය යුතු බව කැනේඩියානු ජනරාල් වරයෙකු වන ක්ලේටන් බීටි (1983-209) තර්ක කර ඇත. නැතහොත් එයට එකම හේතුව වන්නේ සාම සාධන ක්‍රියාවලියඃ

> *ප්‍රතිවාදී භූමිකාවක සිට සාමකාමී භූමිකාවකට ද ගැටුමේ සිට තුන්වන පාර්ශවය මැදිහත්වීමකට ද මානසිකව වෙනස්වීමක් ඇතුළත් කර ගනී. සාම සාධක කාර්යයේ දී සතුරෙක් නැත; එහි අරමුණ වන්නේ එදිරිවාදිකම් මග හැරීමයි, පාර්ශ්වයන් අතර අදහස් හුවමාරුවීම් වර්ධනය කිරීමයි; එසේම සමගිය ගොඩනැගීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන ඒමයි; ඒ සඳහා ගැටුමේ හේතු කාරක පිළිබඳව එනම් දේශපාලන, හමුදාමය සහ ආර්ථික මෙන්ම සමාජ සහ සංස්කෘතික වටපිටාව පිළිබඳව පූර්ණ අවබෝධයක් අවශ්‍ය වේ. නිතරම එය දුෂ්කර සහ ප්‍රකෝපකාරී තත්ත්වයන් යටතේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර අවිශ්වාසය සහ සැකය පවතින වාතාවරණයක් තුළ සාධාරණ මානසිකත්වයක් සහ අපක්ෂපාතී ප්‍රවේශයක් ඉල්ලා සිටී.*

සාම සාධන කාර්යයේ පරමාර්ථය හමුදාමය වශයෙන් (ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සහ අවසන් කිරීම, පරිසරය සුරැකීම ආදිය), දේශපාලන වශයෙන් (නීත්‍යානුකල ආණ්ඩුව යළි ස්ථාපනය කිරීම), සහ ආර්ථිකමය වශයෙන් (සංවර්ධනය උදෙසා වන ප්‍රයත්නයන්ට සහයෝගය දීම) නිර්වචනය කිරීමට ඉඩ ඇති නමුත් අප මෙම තර්කයට එකඟත්වය දැක්විය යුතුය. අවසානයේදී, ප්‍රායෝගික වශයෙන් බිම් මට්ටමේ සාම සාධක මෙහෙයුම් අත්‍යවශ්‍යයෙන්ම මනෝ විද්‍යාත්මක ක්‍රියාවලියකි. ඒ සඳහා ප්‍රදේශයෙහි වැසියන්ගේ සිතුම් පැතුම් හා සංස්කෘතිය කෙරෙහි අතිමහත් සංවේදීතාවක් සහ ඒ ගැන දැනුවත්කමක් අවශ්‍ය වේ. එය එසේ වීමට හේතු වී ඇත්තේ සාම සාධනය පිළිබඳ මූලික ප්‍රතිපත්ති (2 වන කොටස බලන්න) පිළිපැදිය හැකිවන්නේ අදහස් හුවමාරුවීමේ සහ ප්‍රශ්න විසඳීමේ මූලෝපායයන් අතර සමීපතම අනුකලනයකින් පමණක් වීමය. මෙම මූලෝපායයන් සාමාන්‍යයෙන් සාම සාධක මතය සහ භාවිතය සහිත ගැටුම් නිරාකරණය හා සම්බන්ධ වේ.

පුළුල් සාම සාධනය හෙවත් වයිඩර් පීස් කීපිං (Wider Peace Keeping) නම් වූ ප්‍රකාශනයේ විස්තර වශයෙන් පැහැදිලි කර ඇති පරිදි බ්‍රිතාන්‍ය හමුදාවේ සාම සාධන සිද්ධාන්ත කෙතරම් දුරට ගැටුම් නිරාකරණ භාෂාව සමග සංයෝගී වන්නේ දැයි දැකගත හැකිය (British Army, 1994). සාම සහායක මෙහෙයුම් (PSO) ආවරණය කරන ඇමෙරිකානු මතයට ද මෙම ප්‍රවේශය අදාළ වේ. මෙහි දී අනුමැතිය කළමනාකරණය කිරීමට පදනම් වී ඇත්තේ අපක්ෂපාතීත්වය, නීත්‍යානුකූලභාවය, අන්‍යෝන්‍ය

ගෞරවය, අවම බලය පාවිච්චි කිරීම, විශ්වාසනීයත්වය සහ පාරදෘශ්‍ය භාවය යන ප්‍රතිපත්ති මතය. එමෙන් ම එය ගැටුම් නිරාකරණ ක්‍රමවේද වර්ග කිහිපයකට සම්බන්ධ වේ. උදාහරණයක් වශයෙන් යහපත් සන්නිවේදනයක් ප්‍රවර්ධනය කිරීමේ, සාකච්ඡා කිරීමේ සහ මැදිහත්වීමේ තාක්‍ෂණික සහ හදවත් සහ සිත් දිනාගැනීමට ප්‍රමාණවත් වන සම්පත් දායකත්වයක් ඇති ක්‍රියාකාරී සිවිල් කටයුතු පිළිබඳ වැඩසටහන් මගින් ප්‍රජා සබඳතා සඳහා ධනාත්මක ප්‍රවේශයන් ද මේවාට ඇතුළත් වේ. මෙම අනුමැති ප්‍රවර්ධනය කිරීමේ දූඩි හෝ ශිල්පීය සහ මිලිටරි නිපුණතා වෙනුවට තාක්‍ෂණික ක්‍රම, මෘදු නිපුණතා සහ සාම සාධන ක්‍රියාවලීන් ඇතුළත් කර ගැනේ.

මෙම ක්‍රියාකාරකම් සපුරා ලීමේ වගකීම පවරාගනු ලබන්නේ නිවැරදි ප්‍රවෘත්ති පදනමක් ලබාදීම සඳහාය. එමගින් සාම සාධන කාර්යයන්හි යෙදෙන අයට කටකතා, සැක සංකා සහ අගතීන් ආදිය ව්‍යර්ථ කිරීමට හැකිවනු ඇත. එමෙන් ම ගැටුම් පවතින ප්‍රදේශවල විශ්වාසයේ සහ ස්ථාවරත්වයේ වාතාවරණයක් ගොඩනැගීමටත් සාම සාධන කාර්යයේ යෙදී සිටින අයගේ කාර්යභාරය සහ සාම ක්‍රියාවලියේ ස්වභාවය පිළිබඳ වඩාත් ධනාත්මක අවබෝධයක් ඇති කරලීමටත් හැකිවනු ඇත.

සාම සාධන භාවිතාවට විශේෂයෙන්ම අදාළ වන ගැටුම් නිරාකරණය පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ විෂය ක්ෂේත්‍ර දහයක් අපි වෙනත් තැනකදී හඳුනාගෙන ඇත්තෙමු (Ramsbotham and Woodhouse 1996). මෙහිදී අපි එයින් තුනක් ගැන සවිස්තරව පැහැදිලි කරන්නෙමු. මේවා සාම සාධනය භාවිතයේ සහ මානුෂීය මැදිහත්වීම්වල විශේෂයෙන්ම නැකම් කියන බව පෙනේ.

5.1. ගැටුම් විශ්ලේෂණය සහ මානුෂවාදී මැදිහත්වීම

වාර්ගික සහ වෙනත් ප්‍රජා කොටස් අතර දක්වන ගැටුම්වල මූල බීජ සහ ඒවා ඉදිරියට යන ආකාරය පිළිබඳව මුල්ම කාලයට අදාළ සහ වඩාත්ම ගැලපෙන විශ්ලේෂණ, ගැටුම් නිරකරණ න්‍යාය මගින් සපයා ඇත. මෙම විශ්ලේෂණාත්මක දායකත්වය ඇදී යන සමාජ ගැටුම (PSC) සහ ජාත්‍යන්තර සමාජ ගැටුම (ISC) පිළිබඳ වූ න්‍යායාත්මක ආදර්ශ වලින් මානව නිදර්ශනය වෙයි.

එඩ්වර්ඩ් අසාර් (1990) සහ වෙනත් අයගේ ලියවිලි ආදර්ශයට ගනිමින් විවිධ ආකාරයේ ගැටුම් ආරම්භය හා ඒවායේ පැවැත්ම පැහැදිලි කිරීමට උත්සාහ කෙරෙන ආකෘතියක් අපි යෝජනා කර ඇත්තෙමු. සීතල යුද්ධයේ අවසානයේ සිටම සාම සාධන කාර්යයේ නියැලෙන්නන් මෙම ගැටුම් නිරාකරණ කටයුතුවලට සම්බන්ධ වී ඇත. අපගේ ආකෘතිය අනුගමනය කරන්නා වූ ප්‍රවේශය ජාත්‍යන්තර සම්බන්ධතාවලදී සාමාන්‍යයෙන් අනුගමනය නොකෙරේ. අපගේ නිරීක්ෂණය නම්, සමාජ ගැටුම් සාමාන්‍යයෙන් ආරම්භ වන්නේ ප්‍රජා කණ්ඩායම්වලට (වාර්ගික, ආගමික, භාෂාමය සහ වෙනත් සංස්කෘතික ලක්ෂණවලින් යුත් යනුවෙන් නිර්වචනය කරන ලද) තමන්ගේ නිශ්චිත අනන්‍යතාවය හෝ තමන්ගේ සාමූහික සංවර්ධන අවශ්‍යතා සපුරා ගැනීමට ඉඩකඩ ප්‍රතික්ෂේප කළ අවස්ථාවල දී ය.

කල්පවතින සමාජ ගැටුම් උද්ගත වීමට හේතුවන දර්ශක හතරක් අසාර්ගේ ආදර්ශයේ දක්වා ඇත:

- **ප්‍රජා විෂය :** බහු ප්‍රජා සමාජ සංයුතියක ලක්ෂණයන්ගෙන් සමන්විත සමාජ, කල්පවතින සමාජ ගැටුම්වල ආරම්භක ස්ථානයයි.

- **මානව අවශ්‍යතා:** මෙයින් හැඟෙන්නේ ප්‍රවිෂ්ට වීමේ අවශ්‍යතා (සමාජයේ වැදගත් යැයි සැලකෙන ආයතනවල කටයුතුවලට සහභාගීවීම), පිළිගැනීමේ අවශ්‍යතා (හවුලේ පරිහරණය කරනු ලබන සංස්කෘතික අගයන් සහ උරුමයන් මගින් නිර්වචනය කරන ලද අනන්‍යතාව පිළිගැනීම) සහ ආරක්ෂක අවශ්‍යතා (භෞතික සුභ සාධනය) පෙරකී සමාජයක දෝෂ මාර්ගයන් විවර කරන බවයි.

- **පාලන විධි :** පොදුවේ ලැබිය යුතු දෙයක් වේ නම් එය සපයා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම රඳා පවතින්නේ මූලික වශයෙන් රජයේ කාර්යභාරය සහ එහි ස්වභාවය අනුවයි. සාමාන්‍ය වශයෙන් කල්පවතින සමාජ ගැටුම් අත්දකින හෝ එවැනි තත්ත්වයන්ට නැඹුරුවක් ඇති රාජ්‍ය "අකාර්යක්ෂම, පටු ආකල්ප ඇති, දුබල සහ ආධිපත්‍යයික ආණ්ඩුයි. මුළු මහත් ප්‍රජාවේම මූලික අවශ්‍යතා සපයාදීමට මෙම ආණ්ඩු අසමත් වෙයි" (අසාර් 1990. 19).

- **ජාත්‍යන්තර සම්බන්ධතාව :** බහු ප්‍රජා සමාජයක ගැටුම් ක්‍රියාවලියක් දියත්වූ විටක දුර්වල, දරදඬු, පටු මතධාරී රාජ්‍යයන් එය අවුලා ලීමට උත්සුක වෙයි, එය එක් අතෙකින් ගැටුමේ දේශීය භූමිකාව රඟපාන අයට බැහැරින් ලැබෙන ආධාර කපා හැරීමෙන් සහ තමන්හට බාහිර උදව් ලබාගැනීමෙනුත්ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගැටුමේ පරිමාව සහ තියුණු බව පුළුල් වී ජාත්‍යන්තරකරණය වන්නේය. අසාර්ගේ භාෂිතය යොදාගනිමින් ගැටුමේ මෙම තලය අප හැඳින්වූයේ ජාත්‍යන්තර සමාජ ගැටුම යනුවෙනි. මෙය රාජ්‍යයක් නිර්මාණය කිරීමේ ස්වරූපයක් (බොස්නියා), රාජ්‍ය මගින් පාලනය ගෙනයාම සඳහා වන අරගලයක් (රුවන්ඩා), අවසානයේ රාජ්‍ය බිඳවැටීමක් (සෝමාලියා) හෝ ජාතික අනන්‍යතාව අනුව වෙන්වීමේ ගැටුමක් (කොසෝවෝ) නොහැකි වුවත්, ජාත්‍යන්තර සමාජ ගැටුම (ISC) යනු රාජ්‍යයක අර්බුද තත්ත්වයකි.

අසාර්ගේ ක්‍රමානුකූල ගැලපුම් සහ අනෙකුත් ඒ හා සම්බන්ධ ප්‍රවේශයන් සහ ආකෘති වැදගත් වන්නේ ඒවා මෙම විශේෂ ආකාරයේ ගැටුම්වල මූල බීජයන් හා ඉදිරියට යන ආකාරයන් වඩාත් හොඳින් තේරුම් ගැනීමට උදව් වන හෙයිනි. අපගේ ප්‍රධාන තර්කවලින් එකක් වන්නේ ජාත්‍යන්තර සමාජ ගැටුම්වල ස්වභාවය තේරුම් ගැනීමට ඇති අවශ්‍යතාවයි. මෙම ගැටුම් නිරන්තරයෙන්ම තුන්වන පාර්ශවයක මැදිහත්වීමකට ආරාධනා කරන්නේ ඇයිද යන්න සහ ඔවුන් අනිවාර්යයෙන්ම එක්සත් ජාතීන්ගේ සාම සාධක ක්‍රියාකාරීන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියෝග තේරුම් ගැනීමටත් මෙය අවශ්‍ය වේ.

තවදුරටත් ගැටුම් නිරාකරණ න්‍යාය සාපේක්ෂව සලකා බලමින් හසුරුවන ලද ගැටුම් විශ්ලේෂණය ජාත්‍යන්තර ප්‍රජාව විසින් පාදක කරගත හැකි ව්‍යුහයක් සපයයි. සිවිල් යුද්ධ හේතුකොටගෙන පීඩාවට පත්වී ඇති ප්‍රජා කොටස්වලට මානුෂික ආධාර සැපයීමේ දී සහ ජාත්‍යන්තර මැදිහත්වීම් සඳහා යෝග්‍ය වන්නා වූ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ ඒවා සංවර්ධනය කිරීමේදී මෙම පාදක ව්‍යුහයන්ගේ විස්තර ප්‍රයෝජනවත් විය හැකිය. 1999 දී නේටෝව (NATO) සර්බියාවට එරෙහිව මැදිහත් වූ අවස්ථාවේදී ඉගෙන ගත් පාඩම් සමාලෝචනය කරන ජේන් ෂාප් (2000) සඳහන් කරන අන්දමට කොසෝවෝහි

ඇල්බේනියානුවන් මැදිහත් වීම බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් පදනම් කර ගෙන ඇත්තේ නේටෝව විසින් පිළිගෙන ඇති මානුෂවාදී මැදිහත්වීම් පිළිබඳ නව සිද්ධාන්තයක් මතය. කෙසේ වුවද නැගෙනහිර ටිමෝරයේ ජනයාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඒ ආකාරයෙන්ම ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා සලකා බලන්නට සූදානම් වූ අවස්ථාවේ දී බ්‍රිතාන්‍යය ආරක්ෂක මණ්ඩලයේ මැදිහත්වීමකට බලකර සිටියේ නැත.

මානුෂවාදී මැදිහත්වීම් සම්බන්ධ ප්‍රතිපත්ති යොදාගැනීමේ දී ලෝක ප්‍රජාව ස්ථිර ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නම් මෙම ප්‍රශ්නයට අදාළ ජාත්‍යන්තර නීතිය පැහැදිලි කර ගැනීම, සහ මැදිහත්වීම සඳහා එක්සත් ජාතීන්ට ප්‍රමාණවත් බලයක් ලබාදීමට සාමාජික රටවල් උනන්දු කරවීම යන කාරණා දෙකම අවශ්‍ය වේ (එහි ම 78). ජාත්‍යන්තර ප්‍රජාවට අවශ්‍ය වන දෑ කිහිපයක් ඉතා පැහැදිලිය: ඒවා නම්, පළමුවෙන්ම මානුෂවාදී මැදිහත්වීම වලට සම්බන්ධ කාර්යභාරය සහ හැකියාව ප්‍රවේශමෙන් සමාලෝචනය කිරීම; දෙවනුව මෙම කාර්යයට මගපෙන්වන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් පැහැදිලි කර ගැනීම සහ අවසාන වශයෙන්, මැදිහත්වීමට ඇති හැකියාවන් යථාර්ථවාදීව තක්සේරු කිරීමයි. විශේෂයෙන්ම අවසාන කාරණය ගත් කල සාම සාධක කාර්යභාරය තීරණාත්මක වේ. සාම සාධකය සහ ගැටුම් නිරාකරණය අතර ඇති සම්බන්ධතාව පිළිබඳ සලකා බැලිය යුතු කරුණු කේන්ද්‍රීය වශයෙන් වැදගත් වෙයි.

5.2. ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සහ ගැටුම් නිරාකරණය

ප්‍රචණ්ඩ ගැටුම් කළමනාකරණයේ දී යොදාගන්න විවිධ කාලරාමු අතර වැදගත්කම ප්‍රවේශමෙන් හඳුනාගැනීම ගැන ගැටුම් නිරාකරණය න්‍යායයේ මූලික වූ හැඟවීම වන්නේ ක්‍රියාත්මක කරවන අය එක් අතකින් කෙටි කාලීන ගැටුම් විසඳීමේ ද්විත්ව අරමුණු ගැන නිරන්තරයෙන්ම අවබෝධයෙන් සිටීමත් අනිත් අතට දීර්ඝ කාලීන ගැටුම් නිරාකරණය කිරීමත්ය. මෙම විශ්ලේෂණයේදී හඳුනාගෙන ඇත්තේ මූලික ප්‍රශ්න දෙකක් කෙරෙහි සමගාමීව අවධානය යොමු කළ යුතු බවයි. පළමු වැන්න භීෂණය සාර්ථක ලෙස පාලනය කිරීමයි (මූලික වශයෙන් කෙටිකාලීන වූ හමුදාමය කාර්යයකි), දෙවැන්න, දීර්ඝ කාලීන වශයෙන් තිරසාර සාම ගොඩනැංවීමක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා අභ්‍යන්තරයේ සහ ප්‍රජා කොටස් අතරත් අන්‍යොන්‍යව උපකාරී වන සම්බන්ධතාවක් නැවත ගොඩනැංවීමයි. ඉහත ලුහුඬින් දක්වූ පරිදි රාජ්‍ය තනිවත්, එක්සත් ජාතීන් යන කොටස් දෙකම විසින් ප්‍රකාශ කර ඇති අලුත් සාම සාධන සිද්ධාන්තය ශක්තිමත් ස්වරූපයකින් යුත් සාම සාධනයක් ඉල්ලා සිටී. දේශපාලනමය හා සිවිල්මය සාම ගොඩනැංවීමේ කාර්යය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කරන අතර ම එම ශක්තිමත් ස්වරූපයකින් යුත් සාම සාධනයට ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ හැකියාවක් තිබිය යුතුය.

මෙම අලුත් සාම සාධන මතය තුළින් ක්‍රියාත්මක වන්නා වූ සංකල්පයෙන් පැහැදිලි වන්නේ සාම සාධනය මාන දෙකකින් සමන්විත ක්‍රියාවලියක් මතු කළ යුතු බවය. එකක් එය යුද්මය තත්ත්වයකට ළඟා කරයි (එනම් සාම සාධන කාර්යයයේ යෙදෙන අය නිතරම සටන් කිරීමට සූදානම් වී සිටිය යුතුවා මෙන්ම බලය ක්‍රියාත්මක කිරීමේ ශක්තියක් ද පවත්වාගෙන යා යුතුය). ඒ අතරම, කෙසේ වුවද අපක්ෂපාතීත්වයේ ප්‍රතිපත්තිය නියම කරනු බලන්නේ එකඟත්වය ලබාගැනීම සඳහා බලය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සීමා කිරීමට හැකිවන පරිදි අනුමැතිය ගොඩනැංවීමේ හැකියාව ද තිබිය යුතු බවය. මෙය මුදුන් පත් කර ගැනීමට නොහැකි වුවහොත් සාම සාධන කාර්යයයේ යෙදෙන අය දිග්ගැස්සුනාවූ

මිලිටරි බලය යෙදවීමේ ක්‍රියාදාමයකට ඇදීයාමට බොහෝ විට ඉඩකඩ තිබේ. ඒ අනුව 'මොගඩිෂු රේඛාව' තරණය කිරීමේ අනතුරුදායක තත්ත්වය වර්ධනය කර ගැනීමයි. එනම්, පැති ගැනීම සහ ගැටුමට ඍජුවම ඇදීයාමයි. ගැටුම් නිරාකරණයේ ඉලක්ක සහ ගැටුම්වලට පසුව සාමය ගොඩනැංවීම් වෙත නාභිගත වෙමින් සාම සාධන ක්‍රියාවලියේ අනුමැතිය ප්‍රවර්ධනය කිරීමේ මානය කෙරෙහි සාම වෘත්තිකයන් සැලකිලිමත්ව නියැලෙන්නේ නැතිනම් ඔවුන්ට මෙම අලුත් මතය යටතේ මහා පරිමාණයේ යුද්ධයකට මැදිහත්වීමේ අනතුරුදායක තත්ත්වයකට මුහුණ දීමට සිදුවනු ඇත.

බ්‍රිතාන්‍ය සහ ඇමරිකානු සාම සාධක මතය සාම සාධනයේ දී අනුමැතිය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමවේදයන්ගේ වැදගත්කම ඉතා පැහැදිලිව පිළිගනී. මෙම ක්‍රමවේද කොෆී අනන්ගේ ප්‍රකාශිත අරමුණක් වන සාම සහායක මෙහෙයුම් තුළ (PSOs) සාධනීය පෙළඹවීම් ගොඩනැංවීම සහ ශක්තිමත් කිරීමට සමානය. සාම සහායක මෙහෙයුම් (PSO) මතයේදී අනුමැති ප්‍රවර්ධන විධික්‍රමයන් නිර්වචනය කර ඇත්තේ මෙසේය: ප්‍රජා තොරතුරු; මාධ්‍ය මෙහෙයුම්; සිවිල් කටයුතු; සාකච්ඡා කිරීම සහ මැදිහත්වීම් යනු වශයෙනි. සාම සහායක මෙහෙයුමක (PSO) සියලු විවිධ අවස්ථා සහ තලයන් සඳහා සාකච්ඡා සහ මැදිහත්වීම් අවශ්‍ය නිපුණතා බව පෙනේ. මෙම කටයුතුවලට හමුදා පිරිස් සම්බන්ධවීම සිදුවිය හැකිය; ඒ අය අතර කණ්ඩායම් නායකයන් හමුවන ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරීන්ගේ සිට කිසියම් සිද්ධියක් පාලනය කිරීමට සහ ආරාවුලක් වුවත් බේරුම් කිරීමට ක්‍රියා කරන හුදෙකලා ස්ථානයක පිහිටුවා ඇති නිරීක්ෂණ කුටිවල සිටින හමුදා භටයන් ද සිටිය හැකිය.

පුළුල් තලයක සිට බලන විට පෙනෙන ආකාරයට සහ සාම අපකාරක මෙහෙයුම් පරමාර්ථ ගැටුම් නිරාකරණ අරමුණුවලට විවේචනාත්මකව ඇදීමෙන් මෙම මතය මඟින් මතු කරගන්නා තවත් පරමාර්ථයක් වන්නේ, ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් "සාම ක්‍රියාවලියේ කොටස්කරුවන්" බවට වෙනස්කර ගැනීමයි. එසේ කරනු ලබන්නේ ඔවුන්ට අන්‍යෝන්‍යව සහාය වෙමින් වැඩ කිරීමට අවස්ථා සලසා දෙමින් සහ දිරිගැන්වීම්, ප්‍රදානයන් සහ අනුග්‍රහයන් නිර්මාණය කිරීමෙනි. මෙම සාම සහායක මෙහෙයුමේ පුළුල් සංකල්පය සාම සාධක මෙහෙවරවල සිවිල් කාර්ය මණ්ඩල වැඩි වශයෙන් යෙදවීම් විභවයට මගපාදෙයි. එය නිල්පාට මිලිටරි ආරක්ෂක හිස් වැසුම් පාවිච්චිය සමතුලනය කිරීමට සහ අඩුපාඩු සපුරාලීමට සුදුපාට ආරක්ෂ හිස්වැසුම් පාවිච්චියද මෙම සංකල්පයට ඇතුළත් වේ. ඊට පසුව මෙහෙයුම් අතිශයින් සංකීර්ණ වෙමින් සාම සාධනයේ යෙදී සිටින සිවිල් සහ මිලිටරි සංරචක අතර සම්බන්ධීකරණයේ වැඩිවීමක් අවශ්‍යතාවක් මතකරයි. එම වර්ධනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය වන නිපුණතා සහ පුහුණුවීම් ගැන ඊළඟ කොටසේ දී විස්තර කරනු ඇත.

5.3. සාම සාධනය හා ගැටුම් නිරාකරණ නිපුණතා සහ පුහුණුව

ගැටුම් නිරාකරණ විශ්ලේෂණයේ මධ්‍යම ප්‍රවේශයක් වන සාම ගිවිසුම්, මූලික වශයෙන් ජාතික දේශපාලන ආයතන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උත්සුක වන ක්‍රියාවලියක් වශයෙන් දකින්නාවූ සාම සාධක කාර්යයන් සම්බන්ධ සාම්ප්‍රදායික වූ ව්‍යූහාත්මක දේශපාලන ප්‍රවේශය ගැන සංස්කෘතික ප්‍රජාව පිළිබඳ තලයන්හි දී සමාන අන්දමින් සැලකිලිමත්වෙමින් ඌන පූරණය කළ යුතුයි. මෙය සාම සාධන කාර්යයේ නියැලී සිටින අයට විශේෂයෙන් ම අදාළ වෙයි. ඔවුන් ක්‍රියාත්මක වන්නේ සාමකාමී ප්‍රයත්නයන් අතර සංකලනය වන අවස්ථාවකය. එක් අතකින් ව්‍යූහාත්මක දේශපාලන තලයේදී මැදිහත්වී

විසඳුම් ලබාදීම සඳහා තරුච්කාරකම් කිරීමත් අනෙක් අතට සංස්කෘතික ප්‍රජාව පිළිබඳ තලයන්හි දී ඒවා ක්‍රියාත්මක කිරීමත් සිදුවිය යුතුය.

2 කොටුවෙන් පෙනෙන පරිදි ප්‍රජාව පිළිබඳ තලයේ දී සාම සාධන කාර්යයේ නියැළී සිටින අයවලුන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් බොහොමයක් පිළිබඳව ප්‍රදේශයේ ජනතාව සමග සමීප අන්තර් ක්‍රියාකාරීත්වයක් අවශ්‍ය වේ. ඒ අනුව ප්‍රචණ්ඩ ගැටුම්වල දී හැසිරීම කෙරෙහි සමාජ මනෝ විද්‍යාත්මක ක්‍රියාවලියේ බලපෑම පිළිබඳ කිසියම් අවබෝධයක් ඔවුන් විසින් වර්ධනය කර ගැනීම අවශ්‍ය වේ. ඒ සමග ම බෙදී ගොස් ඇති ප්‍රජාවන් අතර සම්බන්ධතා නැවත ගොඩනැංවීමට උපකාරී වන්නා වූ ක්‍රියාවලි සහ නිපුණතා ද වර්ධනය කළ යුතු වේ. කෙටියෙන් සඳහන් කරන්නේ නම්, ගැටුම් නිරාකරණ නිපුණතා පිළිබඳ විශේෂිත පරාසයක් ඔවුන් විසින් ප්‍රගුණ කිරීම අවශ්‍ය වේ.

ඊට අමතර ව මෑතකදී ක්‍රියාත්මක වූ මෙහෙවරවලින් ලත් අත්දැකීම් පෙන්නුම් කරන්නේ සාම සාධක හමුදාවන්ට තම තමන් අතරම සන්නිවේදනයක් පවත්වාගෙන යාමේදී විශාල අපහසුතාවන්ට නිතර මුහුණදීමට සිදුවී ඇති බවයි. එයට හේතුව ඒවාහි විශාල වෙනස්කම්වලින් යුත් බහුජාතික සංයුතියයි. තමන් සම්බන්ධ වී සිටින ප්‍රජාවේ අගයන් පිළිබඳව ඉමහත් අවබෝධයකින් යුතුව සිටීම වැදගත් වනු මෙන්ම ප්‍රජාවන් තුළ එකිනෙකාට සම්බන්ධ වන ආකාරය පිළිබඳ දැන ගැනීම අවශ්‍ය වේ.

ගැටුම් නිරාකරණ නිපුණතා හා ඒකාබද්ධ කරගනු ලබන විශේෂිත සාම සාධන පුහුණු කිරීම්වල අවශ්‍යතාව තියුණු වන්නේ සටන්වලදී අවශ්‍ය වන නිපුණතා සහ සාම සාධන මෙහෙයුම්වල දී අවශ්‍ය වන නිපුණතා අතර වැඩිවෙමින් පවතින්නා වූ වෙනස සලකා බලන කල්හිය (3 කොටුව බලන්න). ඇමරිකානු මිලිටරි චින්තනය අනුව දැන් පිළිගෙන ඇත්තේ සටන් මෙහෙයුම් සිවිල් ජනතාව සමග නිරන්තර අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇති කරගන්නේ ඉතා කලාතුරකින් වන අතර සාම සහායක මෙහෙයුම්වල දී (PSO) ප්‍රචණ්ඩත්වයක් පෙන්නුම් කරන පිරිස් පාලනය කිරීම සඳහාත් සිවිල් ජනතාවට මානුෂවාදී සහනාධාර බෙදාදීමට සහ සාම ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි යටතේ ප්‍රාදේශීය හමුදා භටයන් නිරායුධ කිරීමටත් සමහරවිට මිලිටරි හමුදාව අවශ්‍ය වීමට ඉඩ ඇති බවයි.

මේ කර්තව්‍යයන් සඳහා දේශීය යථාර්ථයන් සමීප වශයෙන් තේරුම් ගැනීම මෙන්ම සිවිල් ජනතාව සමග යහපත් සම්බන්ධකම් වර්ධනය කිරීම අවශ්‍ය වේ. පරමාර්ථ සුරක්ෂිත කිරීමට සහ තමන්ගේ භට කණ්ඩායම්වල ආරක්ෂාව කහවුරු කිරීමටත් ක්‍රමෝපාය තලයේ දී (ක්ෂේත්‍රයේදී) සාකච්ඡා නිපුණතා පරික්ෂාකාරී අන්දමින් පාවිච්චි කිරීම මත ඒවා රදා පවතී. එවැනි සාකච්ඡා පැවැත්විය හැක්කේ හමුදා ඛණ්ඩ අණදෙන නිලධාරීන් විසින් හෝ ජ්‍යෙෂ්ඨ හමුදා බලඇණි මාණ්ඩලික නිලධාරීන් විසිනි. භට කණ්ඩායම් මට්මේ දී හමුදා භටයන් භට තම රාජකාරී චර්යා රටාව අනුව ක්‍රියා කරන අවස්ථාවල දී විවිධාකාරයේ ප්‍රාදේශීය ආරාවුල් ගැන මැදිහත්වීමට හෝ බේරුම් කිරීමට ඉදිරිපත්වීමට සිදුවනු ඇත. සාම සාධනයේ සංවාදශීලී අංශ වෙත මේ ආකාරයෙන් නැඹුරු වීම සාම්ප්‍රදායික හමුදා පිරිස්වල ස්වභාවයෙන් ළංවන්නක් නොවේ. එයට සාම්ප්‍රදායික මිලිටරි සංස්කෘතියේ සැහෙන ප්‍රමාණයක වෙනස්වීම් අවශ්‍යවනු ඇත. එසේ අවශ්‍ය වන්නේ එය වත්මන් සාම සාධන ක්‍රියාවලිය වඩාත් ගැලපෙන සංස්කෘතියක් හෝ මනෝවේදයක් වෙතට ගෙන යාමටය.

සංස්කෘතීන් අතර ප්‍රතිපක්ෂතාව සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් භාවිතාවන් අතර ප්‍රතිපක්ෂතාව ඇත්ත වශයෙන්ම විස්මයාවහ වෙයි. සම්ප්‍රදායානුකූල මිලිටරි චින්තනය අනුව විරුද්ධවාදී අවිගත් පිරිස් සමග සාකච්ඡා කිරීම ගැන සටන් වැදී සිටින හමුදාවන්ට උගන්වා නැත; ඒ වෙනුවට උගන්වා ඇත්තේ ඔවුන් විනාශ කිරීමටය. වඩා අන්තයට නොගිය උදාහරණයක් වන්නේ ඉතා හොඳින් පැහැදිලි කර දී ඇති පරිදි නිරතුරුව සිදුවන පැවරුමක් වන වටලා පරීක්ෂා කිරීමේ මෙහෙයුම සම්බන්ධවයි. සටන් වැදීමේ දී හා සාම සාධනයේ දී ඒ සිදුවන සාමාන්‍ය දෙයකි. සටන් වදින මෙහෙයුමක ගොඩනැගිල්ලක දොරක් විවෘත කිරීමේ දී අනුගමනය කරන සාමාන්‍ය ක්‍රමය වන්නේ එය පුපුරුවා විවෘත කිරීම වැනි සුළු දෙයකි. සාම සාධක හමුදා එම කාර්යයට දූන් ප්‍රවේශ විය යුත්තේ අතිශය දුෂ්කර ක්‍රමවේදයක් වන දොර විවෘත කිරීමට නිවැසියන් පොළඹවා ගැනීම මගිනි (චේල්ස් සහ රාච් 1995).

කොටුව 3 :
මිලිටරි මෙහෙයුම් සහ සාම සාධනය විදහා පාන්නා වූ චර්යා වෙනස්කම් සහ අවශ්‍ය නිපුණතා

සාම්ප්‍රදායික මිලිටරි චර්යා	සාම සාධනය / ගැටුම් නිරාකරණය
සිවිල් ජනතාව සමග සම්බන්ධයක් නොමැති වීම	සිවිල් ජනතාව සමග දැඩි ලෙස අන්‍යොන්‍යව ක්‍රියා කිරීම (සතුරු සෙනග පාලනය කිරීම, සිවිල් ජනතාව අතර මානුෂවාදී සහනාධාර බෙදාදීම, ප්‍රදේශයේ හමුදා නිරායුධ කිරීම ආදිය) සිවිල් මෙහෙවර අංශ සමග සහයෝගය.
මූලික මිලිටරි නිපුණතා යෙදවීම (අසම්බන්ධිත නිපුණතා)	සාකච්ඡා පදනම් වූ නිපුණතා යෙදවීම (සම්බන්ධිත නිපුණතා)
විරුද්ධවාදී සන්නද්ධ අංශ විනාශ කිරීම	විරුද්ධවාදී සන්නද්ධ අංශ සමග සාකච්ඡා කිරීම
ප්‍රතිවාදී භූමිකාව	සන්හිඳියා භූමිකාව
හඳුනාගත් සතුරෙක් සිටීම	සතුරෙකු වශයෙන් හඳුනාගත්තෙකු නොසිටීම: අපක්ෂපාතී කාර්යභාරය
අවසන් ඉලක්කය: මිලිටරි ජයග්‍රහණය	අවසන් ඉලක්කය : පාදක වූ ගැටුම් හේතු නිරාකරණය
බලය යෙදවීමෙන්	එකඟතාව පාදකවීමෙන්

මෙම අවශ්‍යතාවන්ට අනුගත වෙමින් වඩා යහපත් අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට සහ එකඟතාව ලබාගැනීම සඳහා සාකච්ඡා කිරීමට වෘත්තියේ යෙදෙන අයට අවශ්‍ය විය හැකි සන්නිවේදන නිපුණතා සහ සංකල්ප ප්‍රගුණ කර කරගැනීමට උපකාර වන පරිදි සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් සහ ක්‍රමවේද නූතන ගැටුම් නිරාකරණ සිද්ධාන්ත මගින් හඳුනා ගෙන සංවර්ධනය කර ඇත. ඒ සමඟ ම මෙම නව අභියෝගයට ප්‍රතිචාර දක්වීමට අවශ්‍ය නිපුණතා සාම ක්‍රියාකාරීන්හට ලබා දෙනු වස් දැනට බෝහෝ පුහුණු වැඩසටහන් යළි සැලසුම් කෙරෙමින් පවතී. මෙම වැඩසටහන්

ගැන, වෙනත් සන්දර්භ වලට අදාළ, මානව උපයෝගී කොට ගෙන පිරික්සන ලද ගැටුම් නිරාකරණ විශෙෂඥ දැනුම් සම්භාරයක් පවතී.

උගත් පාඩම් සහ භාවිතය

ගැටුම් නිරාකරණ ක්ෂේත්‍රයෙන් සාම සාධන භාවිතයන් සඳහා අනුකලනය කර ගන්නා ලද ප්‍රවේශයනට ඇතුළත් අන්තර්ඥානය දැනුදු බෙහෙවින් පිළිගැනීමට ලක් වී ඇතත් ඒවා තවමත් විධිමත් නොවන අසම්පූර්ණ තත්වයකින් පවතී. උදාහරණයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් දෙපාර්තුමේන්තුවේ ‘උගත් පාඩම් ඒකකය’ මගින් ඕනෑම සාම සාධක මෙහෙයුම් සඳහා ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගය පූර්වාවශ්‍යතාවයක් වශයෙන් හඳුනා ගෙන ඇත. යහපත් සම්බන්ධතා ගොඩ නැගීම පිළිබඳ අංශයේ සමස්ත වැදගත්කම සම්පිණ්ඩනය කොට දැක්වීමට එම යහපත් සම්බන්ධතාව වැදගත් වන්නේ දේශපාලඥයන් සහ නායකයින් සමග නායකයින් සමග පමණක් නොව ගැටුම් පවතින ප්‍රදේශයේ සමස්ත ප්‍රජාවන් සමගය.

- සාම සාධන මෙහෙවර සහ එහි කාර්ය මණ්ඩලය අපක්ෂපාත එකක් බව ප්‍රදේශයේ ජනතාව ප්‍රත්‍යක්ෂ කරගත යුතුය. ගැටුමට සම්බන්ධ පාර්ශවයේ එම මෙහෙවර හෝ එහි සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින් බොහෝ විට කරන පරිදි තමන්ට වාසිවන ආකාරයට හරවා ගැනීමට ප්‍රයත්න දරන අවස්ථාවේදී තම අපක්ෂපාත භාවයේ සහ මධ්‍යස්ථභාවයේ ප්‍රතිරූපය පවත්වා ගෙන යාමට සහ හුවා දැක්වීමට මෙහෙවරට සහ එහි සන්නිවේදන අංශයට හැකියාව තිබිය යුතුය. අපක්ෂපාතීභාවය පවත්වාගෙන යාමට දරන්නාවූ ප්‍රයත්නය මගින් නිෂ්ක්‍රියතාවක් වර්ධනය නොකළ යුතුය. එසේ නොවිය යුතු-වා පමණක් නොව සාම සාධක කාර්යයන්හි නියැලෙන අයවලුන් විසින් තම පැවරුම් දැඩි ලෙස සහ වාස්තවික ලෙස ඉෂ්ට කළ යුතුය.
- එක්සත් ජාතීන් ද තම ක්‍රියාවලදී පාරදෘශ්‍ය භාවය, වගකිව යුතු බව සහ ප්‍රතිපත්තිවලට තිබෙන කැපවීම ප්‍රදර්ශනය කළ යුතුය. එය නීතියට ඉහළින් සිටිනා බවට හැඟීමක් ඇති කර නොගත යුතුය. මෙහෙවරට හෝ එහි කාර්යය මණ්ඩලයට එරෙහිව ප්‍රදේශයේ ජනතාවගෙන් එල්ල වන දුක් ගැනවිලි ගැන සොයා බැලීම සඳහා දුක්ගන්නාරාළ කෙනෙකු නම් කිරීමට හෝ කිසියම් කේන්ද්‍රීය ස්ථානයක් ඇති කිරීම ගැන සලකා බැලිය යුතුය.
- ප්‍රදේශයේ ජනතාව සමග යහපත් සම්බන්ධතාවක් පවත්වාගෙන යාම සඳහා ප්‍රදේශයේ ජනතාවගේ සංස්කෘතික සම්ප්‍රදායන්ට සහ අවශ්‍ය චාරිත්‍ර සහ ආචාර ධර්මවලට ගරු කිරීම වැදගත් අංගයක් වන්නේය. සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ආගන්තුක රටේ ඉතිහාසය, සංස්කෘතිය, සහ එහි ජීවන රටාව පිළිබඳව තතු පහදා දීමට රැස්වීම් පැවැත්විය යුතුය.
- සාමය ගොඩනැංවීම සඳහා වූ ප්‍රයත්නයන් - මූලික ප්‍රජා සේවා පිළිසකර කිරීම සඳහා ආධාර උපකාර සලසා දීම වැනි දේ සහ ව්‍යසනයකට ලක් වී ඇති රටක පුනරුත්ථාපන සහ ප්‍රතිනිර්මාණ කටයුතුවලදී සහයෝගය දැක්වීම වැනි ප්‍රදේශයේ ජනතාව දිනාගැනීමේ මෙහෙයුම් සඳහා ද බිම් මට්ටමේ සහයෝගය වර්ධනය කර ගැනීම සඳහා ප්‍රතිඵලදායක ක්‍රියාමාර්ග විය හැකිය.

- එහි සාම සාධක සහ සාමය ගොඩනැංවීමේ ප්‍රයත්නයන්හි දී පවත්නා වූ ප්‍රාදේශීය අධිකාරී සහ ප්‍රජාවේ වැඩිහිටියන්ගේ මාර්ගයෙන් ඒවා ක්‍රියාත්මක වීම වඩාත් යෝග්‍ය වේ. එහි සාම පියවර ප්‍රදේශයට ආවේණික ගැටුම් නිරාකරණ ව්‍යවහාරයන්ට සමීප වන පරිදි සකස් කරගත යුතුය. එසේ කිරීමේ දී මෙම සාම ප්‍රයත්න මානව හිමිකම් පිළිබඳ පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ මානුෂවාදී නීතියට පරිසරය නොවන බවට වගා බලාගත යුතුය. කෙසේ වුවද, මෑතකදී සිදුවූ සහ දැනටමත් ගැටුම් පවතින්නා වූ ප්‍රදේශවල ස්ථානගත ප්‍රජා නායකයන් තෝරාගැනීමේ දී මෙහෙයුම් මගින් ඉතා පරීක්ෂා කාරී ක්‍රියාපිළිවෙලක් අනුගමනය කළ යුතුය. එය එසේ විය යුත්තේ බොහෝ විට ප්‍රජා කොටස් ඇත්ත වශයෙන්ම නියෝජනය කරනු ලබන්නේ කා විසින් ද යන වග බොහෝ විට පැහැදිලි වන බැවිනි. අරගල, ජනතාව අවතැන්වීම සහ වෙනත් නොවැළැක්විය හැකි තත්වයන් හේතු කොට ගෙන පාරම්පරික සමාජ රටාවන් සහ භූමිකාවන් ඇපැහැදිලි වන්නට හෝ අලුත් වන්නට ඉඩ ඇත. එ නමුත් බොහෝ විට අවිගත් පදනමකින් යුත් සමාජ පද්ධතීන්ට යට වන්නට ඉඩ තිබේ.

- සාම සාධක මෙහෙවර මුහුණුවර කිහිපයකින්ම යුක්ත වන තත්වයකට පත්වන අතර. සාමය ගොඩනැංවීම ඔවුන්ගේ ක්‍රියාවලියට බැඳී තිබෙන කොටසක් බවට පත්වී තිබේ. අවධාරණය ලක් විය යුත්තේ යුද වැදී සිටින පාර්ශවයන් අතර යළි මිත්‍රත්වයක් ඇති කිරීමේ ක්‍රියාදාමය ශක්තිමත් කරන හා ආර්ථික හා සමාජ ව්‍යූහයන් ප්‍රතිනිර්මාණය කරන ක්‍රියාවලීන්ට සහ ආයතනවලට ලබාදෙන උදව් වෙතය. එය එසේ විය යුත්තේ මෙහෙවර හමාර වී පිටව යන අවස්ථාවේ දී රික්තයක් තබා නොගොස් ඒ වෙනුවට රට එතැන් සිට ගොඩනැගීමට ඇති හැකිවන සාමයේ සහ සංවර්ධනයේ පදනමක් ඉතිරි කොට යා යුතු බැවිනි.

- එක්සත් ජාතීන් විසින් සාම සාධක හමුදාවල සංයුතිය ඔවුන්ට ක්‍රියාත්මක කිරීමට සිදුවී ඇති නව සහ නිතිපතා වෙනස් වන කාර්යයභාරයට අනුකූල වන පරිදි සකස් කළ යුතුය. සාමය සහ ආරක්ෂාව පවත්වා ගෙන යාම අත්‍යවශ්‍ය කාර්යභාරය වන අවස්ථාවල දී ප්‍රධාන වශයෙන් හමුදාව සටන්වලට යොදවන සාම කණ්ඩායම්වලින් සමන්විත විය හැකිය. මෙහෙවරෙහි අවධාරණය සාම සහායක සහ සාමය ගොඩනැංවීමේ කටයුතුවලට මාරු වූ පසු මෙය ක්‍රමයෙන් වෙනස් කළ හැකිය. එහිදී රට ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවලට සහාය විය හැකි වැඩිපුර ඉංජිනේරු සහ වෙනත් ඒකක ඇතුළත් කළ හැකිය. සාමය ගොඩනංවීම සඳහා යොදවන අභිමතික අරමුදල් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ විශේෂ නියෝජිතයාට ලැබෙන්නට සැලැස්විය යුතුය. එසේ කළ යුත්තේ විශේෂ නියෝජිතයා විසින් ප්‍රාදේශීය බලධාරීන් හා මානුෂීය ප්‍රජාව වෙත කළ හැකි බලපෑම වැඩි දියුණු කිරීම සඳහාය. මෙහෙවර මගින් මෙම අරමුදල් වෙනත් කාර්යයන් අතරම ක්ෂණික බලපෑම් ඇති කරගත හැකි ව්‍යාපෘති සහ යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීමට යෙදවිය හැකිය.

- එක්සත් ජාතීන්ගේ සාම සාධන කාර්යයේ අනිවාර්ය අංගයක් විය යුත්තේ "වක්‍ර සාම ගොඩනැංවීම" යන සංකල්පය ප්‍රවර්ධනය කිරීමයි, එනම්, රාජ්‍ය-නොවන ප්‍රජාව, වෘත්තියවේදීන්, ව්‍යාපාරික සහ වෙනත් සංවිධාන ජාලයක් ප්‍රතිස්ථාපනයයි.

- කිසියම් මෙහෙයුමක් නවතා දමන අවස්ථාවේ දී ගැටුම්වලට පසුව සාමය ගොඩනැංවීමේ කාර්යයට සහයෝගයක් වශයෙන් කවර ආකාරයේ සම්පත් රට තුළ තබා යා හැකි ද යන කාරණයට සැලකිල්ල යොමු කළ යුතුය.

නිර්දේශය තුළ පිළිගෙන ඇති කරුණක් වන්නේ විසඳුම් තිරසාර වන්නට නම්, ප්‍රදේශයට ආවේණික යථාර්ථයන් සහ සංස්කෘතීන් මත පදනම් විම අවශ්‍ය බවයි. මේවා ප්‍රයෝජනවත් මං සලකුණු වන අතර, වැඩිමනත් කොටසක් රඳා පවතින්නේ ඒවා කෙතරම් සාර්ථක අන්දමින් කාර්යාත්මක තලයකදී ක්‍රියාවට පරිවර්තනය වන්නේ ද යන්න මතයි.

මෙහෙයුම්වල ප්‍රාදේශීය හෝ ක්‍රමෝපාය තලයන්හි ගැටුම් නිරාකරණ ප්‍රවේශයේ භාවිතයන්ගේ යහපත් හා අයහපත් උදාහරණ කිහිපයක්ම ඇත. 1992 අගෝස්තු සහ 1993 මැයි මාසය අතර බොස්නියාවේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක හමුදාවේ සේවය කරමින් බ්‍රිතාන්‍ය බලඇණියේ අණදෙන නිලධාරියා වශයෙන් කටයුතු කළ ලුතිනන් කර්නල් බොබ් ස්ටුවර්ට් ගෙන් ලැබෙන පහත සඳහන් වාර්තාවෙන් විස්තර කෙරෙන්නේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩල සමග විශේෂයෙන්ම ධනාත්මක ලෙස සාකච්ඡා හා සම්බන්ධතා පැවැත්වීම පිළිබඳවයි.

> *..... බලහත්කාරයෙන්ම මාර්ගයක් සාදාගෙන නොසැලකිලිමත්ව යාමට අපට වරමක් නොවීය. අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අප නිතරම බලාපොරොත්තු වූයේ සාකච්ඡා මගිනි. අවසානයේ දී අපට කිසියම් ස්ථානයකට ළඟාවීමට හැකිවේය යන බලාපොරොත්තුව ඇතිව පමණක් රැකවරණය ඇතිව යන කණ්ඩායමක් පිටත් කර හැරීම එතරම් හොඳ දෙයක් නොවේ. ස්ථානීය වශයෙන් සම්බන්ධ කරගත යුතු තැනැත්තන් සමග එක් වී අපගේ කාර්යය සඳහා සතුටුදායක තත්ත්වයක් ගොඩනගා ගැනීමට අපට සිදුවිය. කිසියම් ප්‍රදේශයක සම්බන්ධතා වර්ධනය කිරීම ගැන විශේෂ අවධානය යොමු කිරීම සඳහා මා විසින් පරිපූර්ණ සම්බන්ධීකරණ නිලධාරී ක්‍රමයත් ස්ථාපනය කරන ලද්දේ එබැවිනි.*

සාකච්ඡාකරුවන් විසින් සාර්ථක අන්දමින් ස්ථාපනය කරන ලද මෙම ජාලය ප්‍රදේශයේ ජනතාව පිළිබඳව සහ පවත්නා තත්වය ගැන ඉතා උසස් තලයේ අවබෝධයක් ඇති කළ බව ස්ටුවර්ට් අවධාරණයෙන් කියා සිටී.

මෙහෙයුම් තලයේ දී ගැටුම් නිරාකරණය සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේද යන්නට මෙය හොඳ උදාහරණයකි. එසේ වුවත් ඩේවිඩ් ලාස්ට් (1997, 129 - 130) දක්වා ඇති ආකාරයට ක්ෂේත්‍රයේ නිරත වී සිටින හමුදා භටයන්ට අණ දෙන නිලධාරීන්ට සහ කාර්ය මණ්ඩලයට "සටන් ක්‍රමෝපායයන්, සම්බන්ධීකරණ නිපුණතාව සහ මෙම උපායයන් මෙහෙයුම් තලයේ දී ඒකාබද්ධ කිරීම පිළිබඳව වැඩිමනත් විස්තර අවශ්‍ය වේ." මේ ආකාරයේ මගපෙන්වීමක් ලබාදීම සඳහා ප්‍රායෝගික පර්යේෂණ විශාල ප්‍රමාණයක් පැවැත්වීම අවශ්‍ය වේ. එයට අමතරව පුළුල් පරාසයක පිහිටි විශේෂිත කරුණු අධ්‍යයන සමග අත්දැකීම් සන්සන්දනය කිරීමක් ද සිදුවිය යුතුය. උදාහරණයක් වශයෙන්, සතුරු පිරිසක් විසින් වටකරගත් කල සාම සාධන කාර්යයේ යෙදෙන අය හැසිරිය යුත්තේ කෙසේද? ප්‍රායෝගික වශයෙන් ප්‍රශ්න සාර්ථක අන්දමින් යොදාගන්නේ කෙසේද? (ක්ෂේත්‍රයේ කුමන අවස්ථාවලදී ද?, කුමන අරමුණක් සඳහාද?)

වඩාත් උපායශීලී තලයන්හි දී 1990 ගණන්වලට පසුව මතු වූ ජාත්‍යන්තර ගැටුම් කළමනාකරණ පද්ධතියක රාමුවක් අපට ප්‍රත්‍යක්ෂ වශයෙන් පෙනෙමින් පවතී. මෙය කොසෝවෝහි පැවැති අර්බුදයට ප්‍රතිචාරයක් වශයෙන් මූලිකව ඉස්මතු වූවක් මෙන්ය. 1999 ජුනි මාසයේ දී නේටෝව සහ යුගෝස්ලාවි හමුදාව අතර, ඇතිකරගත් ගිවිසුමෙන් පසුව සහ දෙවනුව, යුරෝපා සංගමය හා රුසියාවේ විශේෂ රාජ්‍ය නියෝජිතායතනයන්ගේ මැදිහත්වීම් අනුව යුගෝස්ලාවියා රජය සමගත් එවැනිම ගිවිසුමකින් පසුව නේටෝව ඔවුන්ගේ ගුවන්ප්‍රහාර නතර කළේය. එයට සමගාමී ව එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ කොසෝවෝහි ජාත්‍යන්තර සිවිල් හා ආරක්ෂක නියෝජනයක් යෙදවීම පිළිබඳ තීරණය ආරක්ෂක මණ්ඩලය ප්‍රකාශයට පත් කළේය. ගැටුම සම්බන්ධයෙන් මෙම නිරාකරණ ක්‍රියා පිළිවෙල පදනම් විය යුතු වන්නේ පහත සඳහන් ප්‍රතිපත්ති මතය. මේවා ජී 8 කණ්ඩායම් විදේශ ඇමතිවරුන් විසින් මැයි 6 වන දින පිළිගන්වන ලදි:

- ප්‍රචණ්ඩත්වයට හා මර්දනයට ක්ෂණික ව සහ විමසා දත හැකි අන්දමේ අවසානයක්;
- යුගෝස්ලොවියානු සන්ධීය ජනරජයේ සියලුම මිලිටරි පොලිස් සහ අර්ධ මිලිටරි හමුදා ඉවත් කර ගැනීම;
- සැහෙන ප්‍රමාණයක නේටෝ සහභාගීත්වයක් සහ ඒකාබද්ධ නායකත්වයක් යටතේ කාර්යක්ෂම ව ජාත්‍යන්තර සහ ආරක්ෂක නියෝජනයක් යෙදවීම;
- සියලුම සරණාගතයන් නිරුපද්‍රිතව ආපසු පැමිණීම;
- ස්වයං පාලන ආණ්ඩු ක්‍රමයක් ලබාදීම සහ කොසෝවෝ විමුක්ති හමුදාවේ (KLA) මිලිටරි තත්ත්වය ඉවත් කිරීම සඳහා දේශපාලන ක්‍රියාවලියක් ආරම්භ කිරීම;
- අර්බුදකාරී ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය එල්ල කරගත් පරිපූර්ණ ප්‍රයත්නයක්.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 7 වන පරිච්ඡේදය යටතේ බලය පවරා ඇති සහ නේටෝහි උතුරු අත්ලාන්තික් කවුන්සිලයෙන් මෙහෙයනවනු ලබන KFOR ආරක්ෂක හමුදාව ජුනි මස 12 වන දින කොසෝවෝ රටට ඇතුළු විය. ප්‍රදේශයේ අන්තර් සිවිල් පරිපාලනයක් ඇති කරන මෙන් ආරක්ෂක මණ්ඩලය මහ ලේකම්වරයාට තවදුරටත් අනුමැතිය දුන්නේය. 1999 ජුලි මාසයේ මැද භාගය වන විට මහ ලේකම්වරයා ක්‍රියාත්මක කිරීම සඳහා සවිස්තරාත්මක වැඩසටහනක් ඉදිරිපත් කළේය. එම වැඩසටහන පසුව එක්සත් ජාතීන්ගේ කොසෝවෝ අන්තර් පරිපාලන මෙහෙවර නමින් හඳුන්වනු ලදී (UNMIKE). මෙම එක්සත් ජාතීන්ගේ කොසෝවෝ අන්තර් පරිපාලන මෙහෙවරට කොසෝවෝ හි සමස්ත ව්‍යවස්ථාදායක සහ විධායක බලතල මෙන් ම අධිකරණයේ පරිපාලනය ද පවරන ලදී. ඒ වැඩ කටයුතු අදියර පහකට ඒකාබද්ධ විය යුතුය. එයට ඇතුළත්වන කාරණා වන්නේ, ආපසු එන සරණාගතයන්ට ආධාර කිරීම, පොදු සේවා ප්‍රකෘතිමත් තත්වයකට පත් කිරීම (සෞඛ්‍ය අධ්‍යාපන, සහ සමාජ සේවා ඇතුළුව) සිවිල් පොලීසිය යෙදවීම (CIVPOL) ; ප්‍රතිපත්ති සැලැස්මක් සකස් කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී සහ ස්වාධීන ස්වයං පාලන තන්ත්‍රයක් ප්‍රවර්ධනය කිරීම සඳහා කීර්තිමත් ආයතන වර්ධනය කිරීම යන අදියර පහයි.

එක්සත් ජාතීන්ගේ කොසෝවෝ අන්තර් පරිපාලන මෙහෙවර (UNMIK) අංශ හතරකට බෙදන ලදී. ඒ හැම එකක්ම සාමය ප්‍රකෘතිමත් කිරීමේ සිවිල් කාරණා ගැන උනන්දු වනු ඇත. මෙම

අංශ හතර හඳුන්වනු ලබන්නේ "සිව් ටැඹ" යනුවෙනි. පළමු වන ටැඹට ඇතුළත් වන්නේ එක්සත් ජාතීන්ගේ මග පෙන්වීම යටතේ තිබෙන සිවිල් පරිපාලනයයි. දෙවෙනි ටැඹ සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා ගේ (UNHCR) මඟපෙන්වීම යටතේ මානුෂීය ආධාර බෙදාහැරීම ක්‍රියාත්මක කිරීමයි. තුන්වන ටැඹ වන යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගය සඳහාවූ සංවිධානය (OSCE) ප්‍රජාතාන්ත්‍රීකරණය සහ ආයතන ගොඩනැංවීම ගැන සැලකිලිමත් වෙයි. හතර වන ටැඹ මෙහෙයවන්නේ යුරෝපා සංගමයයි. එහි කාර්යභාරය වන්නේ ආර්ථික ප්‍රතිනිර්මාණයයි. ගැටුම් නිරාකරණයේ සහ සාමය ගොඩනැංවීමේ පුළුල් පරමාර්ථ ක්‍රියාවට නංවීම සඳහා සංවිධානවල එකතුවක් කටයුතු කරන්නේ කුමන අකාරයෙන් ද යන වගට මෙම ව්‍යූහය හොඳ උදාහරණයක් වශයෙන් හැඳින්විය හැකිය. කොසෝවෝ හි මෙම ව්‍යාපෘතිය කෙතරම් සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වුවාද යන්න ගැන මතයක් ප්‍රකාශ කිරීමට තවම කල්වේලා වැඩි අතර හමුදා මැදිහත්වීම්වලින් පමණක්ම සාමය නැවත ඇති කිරීම සිදු නොවන බව ද පැහැදිලි වෙයි. එබැවින් අප විසින් පළමුවෙන්ම තේරුම්ගත යුතු කරුණක් වන්නේ, එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ සහ / හෝ එක්සත් ජාතීන් සමග හවුල්වී ක්‍රියාකරන්නා විසින් වෙනත් ප්‍රාදේශීය සංවිධාන යටතේ සාම සාධනය සහ සාමය ගොඩනැංවීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර සම්පත් සාර්ථක අන්දමින් සඵල කරගන්නේ සහ යොදාගන්නේ කෙසේද යන්නයි. දෙවනුව, යුද්ධයෙන් ඇලලී ගිය ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට සහ සමනය කිරීමේ කාර්යයන් සමග සම්බන්ධකම් වර්ධනය කර ගැනීමට හා සමීකරණයක් ඇති කර ගැනීමට වඩාත් ඵලදායි කාර්යයන් සොයාගත යුතුය (ආරක්ෂා කිරීමේ සහ රැකවල් ලෑමේ කාර්යය). මෙය ක්‍රියා පද්ධති සංවර්ධනය කිරිමට සමගාමීව පවත්වා ගෙන යා යුතුය. ඒ මගින් විශ්වාසය සහ සහයෝගය පවත්වා ගෙන යාමට හෝ යථා තත්ත්වයට පත් කිරීමට හැකි වේ. එයින් සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම්වලට නියාමාකාරයෙන් සහයෝගය ලබාදිය හැකිය (සිවිල් ගැටුමක නිරාකරණ කාර්යය). අවසන් කොටසේදී මේ කාරණා ගැන වඩාත් සමීපව බලන්නෙමු. 397

7. අනාගත ප්‍රමුඛතා

7.1 ගැටුම් අර්බුද සම්බන්ධයෙන් ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම

පැරණි යුගෝසිලොවියාවේ සහ රුවන්ඩාවේ මුහුණ දීමට සිදු වූ දුෂ්කර තත්වයන් තිබිය දීත් ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව නිරුපද්‍රිතව පවත්වාගෙන යාමේ වගකීම පවරාදීමට ඉතාමත් යෝග්‍ය ආයතනය එක්සත් ජාතීන් බව බොහෝ රාජ්‍ය විසින් නොකඩවා පිළිගනු ලබයි. එයට හේතුව වන්නේ සියලුම රාජ්‍යයන් සෘජුව ම එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ත්, ආරක්ෂක මණ්ඩලයේත් නියෝජනය වන බැවිනි. තවත් හේතුවක් වන්නේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙවරවල අගය බොහෝ දෙනා දැක ඇති අතර ඒ ගැන සෑහීමකට පත් වී සිටීමයි. කෙසේ වුවද, සාර්ථක වූ සාම සාධනය ඇත්ත වශයෙන්ම එක්සත් ජාතීන් මගින් ක්‍රියාවෙහි යොදවන්නේ නම්, පිළිගත් මිලිටරි බලවතුන් හෝ නේටෝව වැනි මිලිටරි සංධාන යටතේ වූ ප්‍රධානජාතීන්ට එම කටයුතු කිරීමට ඉඩ නොහැර සිටින්නේ නම්, අස්ථායි තත්ත්වයකට පත්වීමට ඉඩ ඇති ගැටුම් අවස්ථාවන් හිදී ක්‍රියාත්මක වීම සඳහා තම හැකියාව සෑහෙන ප්‍රමාණයකින් වර්ධනය කර ගැනීම සංවිධානයට අවශ්‍ය වනු ඇත. අනාගතයේ දී සාම සාධක

මෙහෙවර ප්‍රමාණයෙන් කුඩා වීමට ඉඩ ඇති අතර, ඒ අය වෘත්තිය මට්ටමෙන් වඩාත් සංවිධානය විය යුතු වේ; කවරදාටත් වඩා හොඳින් සූදානම් වූ පුහුණු වී සහ සම්පාදනය වී සිටිය යුතුය.

වාසනාවකට මෙන්, එක්සත් ජාතීන්ගේ මණ්ඩලය සැකය, ස්වයං විවේචනය සහ අන්තරාවලෝකනය සහිත වූ කාල පරිච්ඡේදයකින් පසුව තම සාම සාධන හැකියාව දියුණු කර ගැනීම ආරම්භ කර ඇති බවට පැහැදිලි ලක්ෂණ ඇත. ක්ෂණික විහිදුමේ මිතුරන් යනුවෙන් පොදුවේ සඳහන් කරනු ලබන, දළ වශයෙන් රාජ්‍යයන් 27 ක් ක්ෂණිකව විහිදුමක යෙදවිය හැකි මෙහෙවරක ප්‍රධාන කාර්යාලයක් (RDMHQ) ස්ථාපනය කිරීම සඳහා සහයෝගය ගොඩනංවමින් සිටී. සාමසාධන මෙහෙයුම් දෙපාර්තමේන්තුවට (DPKO) ලබාගත හැකි සාම සාධක සම්පත්වල ගුණාත්මක භාවය සහ පරාසය දියුණු කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් 1994 දී එක්සත් ජාතීන්ගේ පොරොත්තු සැලසුම් ක්‍රමයක් (UNSAS) නිර්මාණය කරන ලදී. වඩාත් මෑතකදී ඩෙන්මාර්ක ආණ්ඩුව බහුජාතික අධි සූදානම් පොරොත්තු සේනාංකයක් (SHIRBRIG) සංවිධානය කළේය. එයට දින 15 ත් - 30 ත් අතර වූ ප්‍රක්ෂේපිත ප්‍රතිචාර කාලයක් සහ 4000 ටත් 5000 ටත් අතර වූ භට සංඛ්‍යාවක් සතු බව ප්‍රකාශ වේ. මේ ආකාරයේ වඩාත් හොඳ, විවිධ ආකාරයේ පොරොත්තු සැකසුම් නිර්මාණය කිරීම මගින් එක්සත් ජාතීන්ගේ හමුදාවල ක්ෂණික විහිදුම් හැකියාව වර්ධනය කිරීමේ ප්‍රයත්නයන්ට නෝර්ඩික් රටවල්, නෙදර්ලන්තය සහ කැනඩාව විශේෂයෙන්ම උදව් කිරීමට ඉදිරිපත් වේ (ලැන්ගිල් 2000).

ජාතික තලයේ දී හමුදා දායකත්වය සපයන බොහෝ රටවල් 199- ගණන්වල දී ඔවුන්ගේ සාම සාධන හැකියාවන් සම්බන්ධ කාර්යයේදී විශේෂ දියුණුවක් අත්පත් කරගෙන ඇත. ප්‍රමිතීන් උසස් මට්ටමකට ගෙන යාම සඳහා ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථාන සහ වැඩ සටහන් ස්ථාපනය කර ඇත. ඒකාබද්ධ මෙහෙයුම් පද්ධතියක් ද, ඔවුන් විසින් සාම සාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුව (DPKO) ඇතුළත 1993 දී මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී. මෙය පෙර තිබූ තත්වයට වඩා වැදගත් දියුණුවක් පෙන්නුම් කිරීමකි. පෙර තිබූ තත්ත්වය යටතේ ක්ෂේත්‍රගතව සාම සාධන කාර්යයයේ යෙදෙන අයට එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාර්යාලය සම්බන්ධ කර ගත හැකිවූ වුයේ සාමාන්‍ය වැඩකරන දිනයන්හි කාර්යාල වේලාවන් තුළ දී පමණකි. මෙම තත්ත්වය මධ්‍යස්ථානයේ සෑම දිනකම පැය 24 පදනම යටතේ ක්‍රියාත්මක වෙයි. කාර්ය මණ්ඩලය 24 දෙනෙකි. ඔවුහු ප්‍රධාන මෙහෙයුම් පිළිබඳව එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාට වාර්තා කරයි.

ජාත්‍යන්තර සාම සාධක ප්‍රයත්නයන් මුහුණ දිය යුතු බොහෝ අභියෝගයන් විඳ දරා ගැනීමට ගන්නා වූ ඕනෑම ප්‍රමාණවත් ප්‍රයත්නයක් සඳහා වත්මන් මධ්‍යම සම්පත් ප්‍රමාණවත් නොවන තත්ත්වයක පවතින බව ද පැහැදිලිය. උදාහරණයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සියෙරා ලියෝන් මෙහෙවරට සම්බන්ධ වූ පළමු හමුදා පැමිණ සති කිහිපයක් ඇතුළත කැරලි කණ්ඩායම් විසින් හමුදාභටයන් 500 අල්ලා ගන්නා ලදී. එම මෙහෙවරෙහි පැහැදිලි දුර්වලතාවයට වැඩි වශයෙන් හේතු වූයේ එම අවස්ථාවේ දී එක්සත් ජාතීන්ගේ සියරා ලියෝන් මෙහෙවර (UNAMSIL) විසදෘශ්‍ය හෙවත් අසමානකම්වලින් සමන්විත ජාතික හමුදා කොටස් 30 ක් වීමයි. ඔවුන් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් නොවූ අතරම, ඒකාබද්ධ ප්‍රමිතීන් සහ පුහුණු ක්‍රියාමාර්ගයක් ද නොවීය. මෙහෙයුම් අංශයෙන් ගත් කල එක්සත් ජාතීන්ගේ සියෙරා ලියෝන් මෙහෙවරට (UNAMSIL) නිව්යෝර්ක්හි සාම සාධන මෙහෙයුම් දෙපාර්තමේන්තුව (DPKO) මගින් සහයෝගය ලබා දී ඇති නමුත් ඔවුනට සපයා දී ඇති හැකියාව අවම

වශයෙන් විල්කින්සන්ගේ තක්සේරුව අනුව බොහෝ ආරක්ෂක අමාත්‍යාංශ එය ප්‍රමාණවත් නොවන බවට නිගමනය කරනු ඇත (විල්කින්සන් 2000).

සාම සාධනයේ අනාගතය ගැන මෙම පාඩම් සැලකිල්ලට භාජනය කර ඇති බවට බ්‍රාහිමි වාර්තාවේ (UN 2000) සාක්ෂි ඇත. මෙම වාර්තාව සම්පාදනය කරන ලද්දේ කොෆී අනන් විසින් කැඳවන ලද මණ්ඩලයක් මගිනි. එම මණ්ඩලයේ සභාපති වූයේ ඇල්ජීරියාවේ හිටපු විදේශ අමාත්‍ය ලක්ඩාර් බ්‍රාහිමිය. එහි තීරණ මණ්ඩලය මගින් 2000 අගෝස්තු මස ප්‍රකාශයට පත් කරන ලදී. සාම මෙහෙයුම් සඳහා එක්සත් ජාතීන්ගේ ධාරිතාව වර්ධනය කර ගැනීමට පුළුල් අන්තරයක පැතිරුණු නිර්දේශ සමූහයක් එහි දක්වා තිබුණි. එහි අරමුණ වූයේ හමුදා යෙදවීමේ අවධියට පෙර සමයේ දී සැලසුම් සහගත ආකාරයට ඒවා සූදානම් කිරීමෙන් අසාර්ථක තත්වයන් වළකාලීමට සහ පවරන ලද පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන හමුදාවල මට්ටම සහ සම්පත් වඩාත් තාත්වික අන්දමින් අවබෝධ කර ගැනීමටය. වාර්තාව නිර්දේශ කරනු ලබන්නේ තාත්වික හා මුදුන් පත් කරගත හැකි පැවරුම් ලබාදුනහොත් හෝ දුන් විට පමණක් හමුදා යෙදවිය යුතු බවයි. එමෙන්ම පවරන ලද එම පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍යවන සම්පත් සපයන බව ද පැහැදිලි විය යුතුය.

ක්ෂණික විහිදුම් විෂය ගත් කල වාර්තාව තවදුරටත් නිර්දේශ කරන්නේ එක්සත් ජාතීන් විසින් නිර්වචනය කළ පරිදි 'ක්ෂණික සහ ඵලදායී විහිදුම් ධාරිතා' යනු ආරක්ෂක මණ්ඩල යෝජනාව සම්මත වී දින 30 ක් ඇතුළත පූර්ණ සම්ප්‍රදායික සාම සාධන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් හැකියාවයි. සංකීර්ණ සාම සාධන මෙහෙයුම් තුළ දී එය දින 90ක් ඇතුළත දී විය හැකිය. මෙම පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා එක්සත් ජාතීන්ගේ පොරොත්තු සැලසුම් ක්‍රමය (UNSAS) යටතේ හවුල් ගිවිසුමකට එළැඹීමට සාමාජික රටවල් ධෛර්යමත් කළ යුතුය. එමෙන් ම නියමිත ප්‍රතිචාර කාලය ඇතුළත සාර්ථක අන්දමින් යෙදවීම සඳහා එකිනෙකා හා හොඳින් ගැලපෙන සේනාංක ප්‍රමාණයේ හමුදා කිහිපයක් සාදාගත යුතු වේ. 399

කෙසේ වුවද, වාර්තාව අවධානය යොමු කරන්නේ මිලිටරි හැකියාවන් දියුණු කර ගැනීම පිළිබඳ පමණක් නොවේ. එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම්වල සිවිල් අංශයේ හැකියාවන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය ද එම වාර්තාව පිළිගෙන ඇත.

7.2. මිලිටරි හමුදා සම්බන්ධීකරණය, සමතුලනය සහ වෙන්කොට හඳුනා ගැනීම, සාම සාධනයේ පොලිස් සහ සිවිල් භූමිකා

සාම සාධනයේ දී වඩාත් ශක්තිමත් ඉගැන්වීමක් සහ අභ්‍යාසයක් ස්ථාපනය කිරීම සඳහා දැනටමත් ගනු ලබමින් සිටින ප්‍රයත්නය ගැටුම් නිරාකරණයේ සහ තිරසාර භාවයක් ගොඩනැංවීම සඳහා වන දිගු කාලීන ඉලක්ක සහ සමීපතම අයුරින් ඒකාබද්ධ කරගත යුතුය. මතක තබා ගැනීමට අවශ්‍ය කරුණක් වන්නේ සාම සාධක හමුදාවල මැදිහත්වීම් හේතු කොට ගෙන ගැටුම් සාර්ථකව පාලනය කරගත හැකි වූ අවස්ථාවේ දී වුවත් ප්‍රජාවන් කෙරෙහි වන ප්‍රචණ්ඩත්වයේ බලපෑම සාමාන්‍යයෙන් කලක් තිස්සේ පවතින බවයි. නිරන්තරයෙන්ම වාගේ සිවිල් යුද්ධයන්හි කුරිරු අත්දැකීම්වලට ඉහත දී ලක් වී ඇති සමාජ යුදකාමී කල්ලි නායකයන්ගේ පාලනයට භෞතික වශයෙන් හා මානසික වශයෙන්

යටත් වෙති. ඩේවිඩ් ලාස්ට්ගේ වචනවලින් කියැවෙන අන්දමට නොමැරී ජීවත් වන්නේ දැඩි මත දරන්නන් පමණක් බව ඔවුනට ඒත්තු යයි (ලාස්ට් 2000-82) යෝජනා කරන්නේ ඃ

> *යුද්ධයෙන් ඇලලී ගිය සමාජවල සාමය සහ සහයෝගය නැවත ගොඩනැංවීම සඳහා ඇත්ත වශයෙන්ම අපගේ හැකියාවේ හිඩැස් දෙකක් ඇත. පළමු හිඩැස වන්නේ පාර්ශව දෙක අතර පවතින ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සඳහා අප තුළ ඇති හැකියාව තුළ ය. උකුස්සන් කුඩු කිරීමට මෙය අවශ්‍ය වේ. විශ්වාසය ගොඩනැංවීම සඳහා අප තුළ ඇති හැකියාව දෙවන හිඩැසයි. එය පාර්ශවයන් අතර, සහයෝගිතාවට ඉඩකඩ ලබාදෙයි. මෙම තත්වය සාම පරෙවියන් මුදා හරියි.*

ප්‍රචණ්ඩත්වය පාලනයේ සහ සම්බන්ධතා නැවත ගොඩනැගීමේ ප්‍රතිවිරුද්ධ පරමාර්ථ අතර හිඩැසක් ලාස්ට් තවදුරටත් හඳුනා ගනියි. සාම සාධන ක්‍රියාවලියෙහි ප්‍රායෝගික පළපුරුද්දක් ඇති කැනේඩියානු හමුදා නිලධාරියෙකු වශයෙන් පමණක් නොව සාම සාධන ක්‍රියාවලියෙහි යෙදෙන අපගේ මෙහෙයුම් අවශ්‍යතාවල ප්‍රයෝජනය සඳහා ගැටුම් නිරාකරණ විශ්ලේෂණවල අභ්‍යන්තර තත්ත්වයන් ඉදිරිපත් කිරීමේ ප්‍රයත්නයන්හිදී පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ප්‍රමුඛ පෙළේ විද්වතෙකු වශයෙන් ද සැලකෙන ඩේවිඩ් ලාස්ට් මේ පිළිබඳව අදහස් දැක්වීමට විශේෂ සුදුසුකම් ලත් අයෙකු ලෙස ද සැලකේ. මෑතකදි ඔහු විසින් බොස්නියාවේ කරන ලද දේ මේ අවස්ථාවට බොහෝ සෙයින් අදාළ වනවා මෙන්ම අවධානයට ලක් වේ. මෙම ඡේදය අවසන් කරනු ලබන්නේ එහි දී ලබාගත් ඔහුගේ අදහස් පිළිබඳ සමාලෝචනයකිනි (ලාස්ට් 2000 . 08. 96).

ලාස්ට් විසින් හඳුනාගන්නා ලද සමහර හිඩැස් වසා දැමීම සඳහා නූතන සහ අනාගත සාම සාධන මෙහෙයුම් තුළදී මිලිටරි, පොලිස් සහ සිවිල් අංශවල ගැටුම් නිරාකරණ කාර්යභාරයන් අතර ඵලදායී වෙන් කොට හඳුනාගැනීමක් වෙනුවෙන් පැහැදිලි කොන්දේසි සැපයිය යුතු වේ. ඒ අතරම, මෙම කොටස් අතර, ඌන පූරක තත්වයක් වර්ධනය කළ යුතුය. එවැනි ඌන පූරක තත්ත්වයන්හි පළමු තලය වන්නේ මිලිටරි සහ පොලිස් රාජකාරි කාර්යයන් අතරය. සාම සාධන කාර්යයෙහි යෙදෙන අය විසින් විවිධ තලයන්හිදී ආරක්ෂාව සැපයිය යුතු වේ.

සාම සාධනයේ සාම්ප්‍රදායික මිලිටරි කාර්යභාරය වන්නේ සෑම විටම මිලිටරි බලය සංවිධානාත්මකව යොදා ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමේ ප්‍රයත්නයයි. එයට සම්බන්ධ විවිධ කර්තව්‍යයන් මිලිටරි සැලසුම් කිරීම් තලයේ ආරක්ෂාව පිළිබඳව ක්‍රියා කරනු ලබයි (කොටුව 2 බලන්න). මේවා ගැන අවධානය යොමු කිරීමෙන් පසුව අදාළ කාර්යයෙහි නියැලෙන අයවලුන් විසින් සැලකිල්ලට ගත යුතු කරුණක් වන්නේ තවත් ආරක්ෂක තලයක් පිළිබඳවයිඃ එනම්, ප්‍රජා කොටස් තුළ ආරක්ෂාව සැලසීමයි. අත්දැකීම් පෙන්වා දී ඇත්තේ මිලිටරියට එල්ලවන විරෝධයට ප්‍රතිචාර දැක්වීමේ දී මිලිටරි හමුදා ඉමහත් සේ ඵලදායී විය හැකි නමුත් කැරළි, පුද්ගලයන්ට එරෙහි තර්ජන, බිය ගැන්වීම් සහ දේපළ හානි කිරීම ගැන ක්‍රියා කිරිමේදී එතරම් ඵලදායී නොවන බව පෙනී යයි. පශ්චාත් ගැටුම් සාම ගොඩනැංවීමේ කාර්යයේ යෙදී සිටින අයට අපකීර්තිමත් දුෂ්කර කාර්යයක් වන්නේ ගැටුමක දී වර්ධනය වීමට ඉඩ ඇති සාපරාධී අලාභ හානි සහ ප්‍රචණ්ඩත්වය මැඩ පැවැත්වීමයි.

මෑතකදී සිදු කරන ලද විහිදුම්වලදී නැවත නැවත මතුවන, ප්‍රජාව හා පෞද්ගලික ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් වන්නේ ආපසු පැමිණෙන සරණාගතයන්ගේ ආරක්ෂාව හා මානව හිමිකම් සහ අනාරක්ෂිත පරිසරියක් සඳහා ආරක්ෂාව සැපයීමයි. එය අවශ්‍ය වන්නේ එවන් පරිසරයක ව්‍යාපාර ඇති කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යාපෘති ස්ථාපනය කිරීම සඳහාය. මෙම ප්‍රශ්නවලට සැලකිල්ල යොමු කිරීමට ආධාරකයක් වශයෙන් ප්‍රචණ්ඩත්වය පාලනය කිරීම සහ නීතියේ ආධිපත්‍යය ස්ථාපනය කිරීම සඳහා පුළුල් පරාසයකින් යුත් ප්‍රවේශයක් ඇති කළ යුතු බවට ඩේවිඩ් ලාස්ට් සහ තවත් අය අදහස් දක්වති. බොහෝ සාම සාධන මෙහෙයුම්වලදී මිලිටරී හමුදා විහිදුවනු ලබන්නේ සාමය පවත්වාගෙන යාම සඳහාය. ඉන් පසුව සිවිල් පොලිස් හමුදා ක්‍රමයෙන් පුහුණු කොට ඉදිරිපත් කරනු ලැබේ.

ඵලදායී ස්ථානීය පොලිස් කටයුතු සඳහා වූ අවශ්‍යයෙන්ම කළ යුතු මෙම සංක්‍රාන්ති කෙසේ වුවද සරල දෙයක් නොවේ. සිවිල් පොලීසියට (CIVPOL) සහ ජාත්‍යන්තර පොලිස් පුහුණුකරුවන්ට එය පුහුණු කොට සාර්ථක ස්ථානීය පොලිස් හමුදාවක් වශයෙන් නීතිගත කිරීමට දීර්ඝ කාලයක් ගත විය හැකි අතර, සමාජය තුළ ජීවත්වන ජනතාවට රැකවරණය සපයා දීමේ දී පොලීසිය දරන ප්‍රයත්නය ගැන ජනතාව තුළ විශ්වාසය ඇති කිරීම සාමාන්‍යයෙන් හදිසි කටයුත්තකි. මූලික සාම සාධන විහිදුමට අනුපූරක මිලිටරි පොලිස් බලකායන් සහ සාමාන්‍ය පොලිස් කටයුතුවල යෙදෙන පිරිස් පූර්ණ ආකාරයෙන් ඒකාබද්ධ විය යුතු බව ලාස්ට් යෝජනා කර ඇත.

මේ පිළිබඳව විශේෂිත වශයෙන් අදාළ වන උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ එල් සැල්වදෝර් නිරීක්ෂණ මෙහෙවර (ONUSAL) තුළ පිහිටුවන ලද අතිරේක තාවකාලික පොලීසිය (PAT) සැලකිය හැකිය. මෙහි දී ඒකක සමන්විත වූයේ එල් සැල්වදෝරි නිරීක්ෂණ මෙහෙවරෙන් (ONUSAL) ලබාගත් සිවිල් පොලිස් (CIVPOL) නිලධාරීන් විසින් මෙහෙය වන නව නව පොලිස් ඇකඩමියක් සඳහා තෝරාගත් කැඩෙට් භටයන්ගෙනි. මෙය මිලිටරි සාම සාධක භටයන් විසින් සපයන ලද මහා පරිමාණයේ ආරක්ෂාව සහ ප්‍රජා තලයේ ඇති පුද්ගලික ආරක්ෂක සේවය අතර ඇති පරතරය සාර්ථක අන්දමින් ඉවත් කිරීමට උපකාරී වෙයි.

ඉතා පැහැදිලි කරුණක් වන්නේ වත්මන් සාම සාධන මෙහෙයුම් නියමාකාරයෙන් පුහුණු කරන ලද සිවිල් පොලිස් නිලධාරීන්ගේ බලවත් ඌනතාවයකින් මෙන්ම පොදුවේ පිළිගත් නීතියේ ආධිපත්‍යයක් නොමැතිකමින් ද පෙළෙන බවයි. එක්සත් ජාතීන් විසින් පහත සඳහන් අංශවල සංවර්ධනයේ අවශ්‍යතාව හඳුනා ගැනීම මන්දගාමී ලෙස ආරම්භ කර ඇත.

- කුඩා අතිරේක භට කණ්ඩායම් සහ ශොන්ඩාම පොලිස් හමුදා (පොලිස් කටයුතුවලට පමණක් නොව මිලිටරි උපායශීලී මෙහෙයුම් සඳහා පුහුණුව ලබා ඇති මෙන්ම ඒකක වශයෙන් සහ තනිතනිව හෝ කුඩා කණ්ඩායම් වශයෙන් විහිදුම් කිරීමට හැකියාව ඇති);
- ප්‍රදේශයකට ආවේණික වූ පොලිස් කටයුතු සහ ඒ හා සම්බන්ධව නෛතික සහ දණ්ඩන ආයතන,
- පොලිස් ඇකඩමි කළමනාකරණය කිරීමේ පළපුරුද්ද මෙයට මානව අයිතිවාසිකම්, අපරාධ වැළැක්වීම් සහ යහපත් ප්‍රජා සම්බන්ධතා පිළිබඳ වැඩසටහන් ඇතුළත් විය යුතුය (Call and Barnett 2000 pp.43-68).

කොටුව 4
සාමය ගොඩනැංවීමේ ක්‍රමොපාංග, කාර්යභාර සහ නිපුණතා

සංරචක	පැවරුම්	නිපුණතා
ආරක්ෂාව	මුදවා ගැනීම, නිරායුධකරණය බිම් බෝම්බ ඉවත් කිරීම සිවිල් ජනතාවගේ ආරක්ෂාව පොලිස් සහ ආරක්ෂක ප්‍රතිසංස්කරණ පුද්ගල ආරක්ෂාව (එනම් මාර්ගික, සංස්කෘතික, ලිංග විශේෂිත ප්‍රචණ්ඩත්වය) මානව අයිතිවාසිකම්	ප්‍රචණ්ඩ නොවන සිවිල් ආරක්ෂාව සාක්ෂි දැරීම, සහායනය වටපිටාව නිරීක්ෂණය සහාය සහ ජාල ක්‍රියාකාරීත්වය
පාලනය	ආයතනික ධාරිතා වර්ධනය පාරදෘශ්‍යභාවය/ වගකිව යුතු බව මැතිවරණ සහයෝගීතාව	රැස්වීම් සඳහා පහසුකම් සැලසීම කණ්ඩායම් නායකයින් සංවර්ධනය කිරීම කණ්ඩායම් තීරණ ගැනීමේ ක්‍රම ධෛර්යමත් කිරීම සහ සහයෝගය
සහනාධාර සංවර්ධනය	යටිතල පහසුකම් සංවර්ධනය වෙළඳපොළ ප්‍රතිසංස්කරණ ආර්ථික ආයතන සුළු ව්‍යවසාය මූලික අවශ්‍යතා සපුරාලීම සමාජ සේවා	ඉංජිනේරු/ ශිල්පීය නිපුණතා ව්‍යවසාය නිපුණතාව ව්‍යවසාය සංවර්ධනය ව්‍යාපාර නිපුණතා නායකත්වය හා ඉගැන්වීම මායිම් හරහා සම්බන්ධතා ගොඩනැංවීම
යළි ස්ථාපනය කිරීම	මනෝ සමාජයීය ක්ෂතිය සරණාගතයින්ගේ පුනරාගනමය සාම අධ්‍යාපනය ප්‍රජා උපනයනය	අන්තර්පුද්ගල සන්නිවේදනය කණ්ඩායම්වල ඉඩසැලසීම ගැටුම් නිරාකරණ නිපුණතා ගැටුමේ මනෝ - සමාජයීය ගතිකයන් කළමනාකරණය

වෙන් කොට හඳුනා ගැනීමේ දෙවන තලයකට සම්බන්ධ වන්නේ එක් අතෙකින් මිලිටරි සහ පොලිස් රාජකාරී අතර තිබෙන නොවැළැක්විය හැකි සම්බන්ධය සහ අනිත් අතින් සිවිල් ජනතාව අතර, පුළුල් වශයෙන් ඇති සාමය ගොඩනැංවීමේ භූමිකා අතර ය. සාමය ගොඩනැංවීමේ දී ක්‍රමොපාය කොටස් හතරක් ලාස්ට් හඳුනා ගනී. මේ කොටස් හතරෙන් හැම එකක්ම (ආරක්ෂක, පාලන, සහන

සංවර්ධනය සහ සමගිය යළි ගොඩනැංවීම) පුළුල් පරාසයක පිහිටි පැවරුම්වලින් සමන්විත වේ. ඒ හැම පැවරුමකමටම ඒ ආශ්‍රිත නිපුණතා අවශ්‍ය වේ (කොටුව 4 බලන්න)

ප්‍රායෝගික වශයෙන් ගත් කල සාමය ගොඩනැංවීමට සහාය වීම සඳහා අවශ්‍ය වන නිපුණතා පරාසය සහ ආකෘතික ජාත්‍යන්තර මෙහෙවර තුළ ගැබ් වී තිබෙන නිපුණතා අතර, හිඩැස් මාලාවක් ලාස්ට් හඳුනා ගෙන ඇත. "හඳුනාගන්නා ලද සාමය ගොඩනැංවීමේ ප්‍රධාන කොටස් හතරෙන් එක් එක් කොටස සඳහා අවශ්‍ය වන නිපුණතා විහිදුවීමේ දී අපි සම්පූර්ණ වශයෙන් සාර්ථක වී නැත්තෙමු" (ලාස්ට් 2000 - 87). ඒ අනුව උදාහරණයක් වශයෙන් අවශ්‍ය වන මිලිටරි ස්ථාවර භාවය සපයාදීමට මෙහෙවරක මිලිටරි සංරචකයට හැකිවන අතර, සහයෝගීතා සබඳකම් නැවත ගොඩනැංවීමට අවශ්‍ය වන නිපුණතා සාමාන්‍යයෙන් දක්නට නොමැත. ලාස්ට් විසින් නිර්දේශ කර ඇති එක ප්‍රවේශයක් වන්නේ ප්‍රජාව පාදක කරගත් සාමය ගොඩනැංවීමේ සිවිල් ව්‍යාපෘති තවදුරටත් සංවර්ධනය කිරීමයි. මෙහි පරමාර්ථය වන්නේ මෙහෙවර තුළට සිවිල් හැකියාවන් වඩාත් හොඳින් බද්ධ කිරීමයි. ඒ අතරම සාමය ගොඩනැංවීම සඳහා අත්‍යවශ්‍ය නිපුණතා කීපයක් සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීමයි.

ලෙස්ටර් බී. පියර්සන් ජාත්‍යන්තර ජාත්‍යන්තර සාම සාධක පුහුණු මධ්‍යස්ථානය මගින් මෙම ප්‍රවේශය ප්‍රායෝගිකව ක්‍රියාවට නගන ලදී. මෙය අසල්වැසි පහසුකම් සපයන්නන්ගේ ව්‍යාපෘතිය නමින් හා ස්වරූපයෙන් බොස්නියානු නගරයක් වන බන්යාලුකා හිදී ක්‍රියාත්මක විය. ව්‍යාපෘතියට සම්බන්ධ වූ කණ්ඩායමට ප්‍රදේශයේ අය 20 ක් (බොස්නියානු මුස්ලිම්, සර්බ් සහ ක්‍රොඇට්ස්) අයත් වූ අතර ජාත්‍යන්තර පහසුකම් සලසන්නන් 5 දෙනා ප්‍රජාවේ සහයෝගය උත්තේජනය කිරීම සඳහා හේතු කාරක වූහ. මේ හේතු කොට ගෙන දේශීය ජනයාට ජාත්‍යන්තර නිපුණතා සහ සම්පත්වලින් සාර්ථක ප්‍රයෝජන ලබාගැනීමට හැකි විය. ජංගම කණ්ඩායමක් සහිත ප්‍රජා මධ්‍යස්ථානයක් ඉදි කරන ලදී. මෙහි ප්‍රකාශිත අරමුණ වූයේ ප්‍රදේශයේ ප්‍රශ්නවලට සාමකාමී විසඳුම් සොයාගැනීමට උදව් කිරීමයි. එම මධ්‍යස්ථානයේ වැඩකටයුතු ලාස්ට් සම්පිණ්ඩනය කරන්නේ මෙසේය.

> *"ප්‍රජා මධ්‍යස්ථානයක් සහ එහි කණ්ඩායම්, අන් සියලු සේවාවන්ට සහ ප්‍රචණ්ඩ ගැටුම්වලින් වූ හානියක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උදව් කිරීමට එම ප්‍රදේශයට පැමිණෙන සංවිධානවලට මැලියමක් බඳුය. එය එසේ වන්නේ කණ්ඩායම් මූලික වශයෙන් ප්‍රදේශයට ආවේණික මෙන්ම ජාත්‍යන්තර ද වන බැවිනි. ඔවුහු රට බිම් මට්ටමේ සිට ඉහළට නැවත ගොඩනැංවීමට උත්සාහ කරන අතරම දීර්ඝ කාලීන ප්‍රයත්නයක් සඳහා එහි නතරවන ජනතාව සංවර්ධනය කරති"*

මැදිහත්වීමකදී මෙම කණ්ඩායම්වලට විවිධ කොටස් හා ක්‍රියාකාරීන් අතර, වටිනා සම්බන්ධීකාරකයක් වශයෙන් ක්‍රියා කිරීමට හැකිවන වන බව ලාස්ට් පෙන්වා දෙයි. ඒවා නම් මිලිටරි හමුදාව ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සහ ප්‍රදේශයේ ජනතාවයි. විශේෂයෙන් තෝරාගත ඇති, පුහුණුවක් ලැබූ පුද්ගලයන්ගෙන් සමන්විත මෙම කණ්ඩායම්වලට විවිධ නිපුණතා සම්භාරයක් තවදුරටත් එකතු කරගෙන කොටු අංක 4 හි සඳහන් අවශ්‍ය පැවරුම් වලින් බොහොමයක් ගැන ක්‍රියා කළ හැකිය. මෙම ප්‍රවේශය ගැන විශේෂයෙන්ම බලාපොරොත්තු තැබිය හැකිය. ඒ

සමතුලිත ජාතික ජාත්‍යන්තර සංයුතියකින් යුක්ත වී තිබීමයි. ඒ හේතුවෙන් පුළුල් පරාසයක පිහිටි සාමය ගොඩනැංවීමේ නිපුණතා මෙම කණ්ඩායම් තුළ සෑම අවස්ථාවකදීම නියෝජනය වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුහු දේශීය ප්‍රශ්නවලට දේශීය විසඳුම් සෙවීම සඳහා සම කළ නොහැකි හැකියාවකින් ශක්තිමත් වී සිටිති.

එක්සත් ජාතීන් විසින් දැනට "සංකීර්ණ සාම මෙහෙයුම්" යන පාඨයෙන් හඳුන්වනු ලබන විවිධ අංශයන්ටත් ඒකාබද්ධතාව සඳහා වඩාත් විශාල වූ ධාරිතාවක් ලබාදීමේ අවශ්‍යතාව බ්‍රාහිමි වාර්තාවේද විශේෂිත වශයෙන් දක් වේ. නිරාකරණ කෝණවලින් සලකා බලන කල ඉතා වැදගත් සේ පෙනී යන්නේ සාමය සහ ආරක්ෂාව සඳහා වන විධායක කමිටුව එක්සත් ජාතීන්ගේ ස්ථිර වූ ධාරිතාව ශක්තිමක් කිරීම සඳහා සැලැස්මක් ඇති කිරීමට නියෝග කර ඇති බවයි. ඒ සාමය ගොඩනැංවීමේ නිර්මාණය කිරීම මෙන්ම එම ක්‍රමෝපායයන් ආධාර වන ආකාරයේ යෝග්‍ය වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. එය මිලිටරි ආරක්‍ෂණ කාර්යය වෙනුවෙන් සාර්ථකව ආදේශ කිරීම හා වර්ධනය සඳහා වඩා ඒකාබද්ධ වූත් සිවිල් පුරවැසි භූමිකා අපේක්‍ෂා කරන අතර ම පශ්චාත් ගැටුම් සාම ගොඩ නැඟුම සඳහා අදාළ සුවිශේෂි අභියෝගයන්ට විසඳුම් ද අපේක්‍ෂා කරයි.

අධිකරණ, දණ්ඩන, මානව හිමිකම් හා අනෙකුත් විශෙෂඥයින් වඩාත් සාර්ථක පූර්ව මෙහෙයුම් සූදානම් වීමක් අනුමත කෙරෙන අතර ඔවුන් සිවිල් පොලිස් විශෙෂඥයින් ද සමඟ එක්ව "නීතියේ ආධිපත්‍ය" විද්‍යාර්ථී කණ්ඩායම් සාදාගනු ඇත. වඩාත් වැදගත් වන්නේ, සාම සාධනයේ ගැටුම් නිරාකරණ පරිමාණයන්ට අනුරූප ව සාමය හා ආරක්‍ෂාව පිළිබඳ විධායක කමිටුව විසින් සාමය ගොඩනැඟීමේ උපායයන් සැකසීම සඳහා මෙන්ම එම උපායයනට ගැළපෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ස්ථාවර ධාරිතාව ශක්තිමත් කරනු සඳහා සැලැස්මක් සකස් කිරීමට ඉඩ සලසා ඇත.

මෙම ක්‍රියාවලියට තවදුරටත් හැකියාව ලබාදීම සඳහා දේශපාලන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ඇතුළත සාමය ගොඩනැංවීමේ නියමු ඒකකයක් නිර්මාණය කිරීමේ වෑයමට වාර්තාව සහයෝගය ලබාදුනි. නියමු වැඩසටහන් පිළිබඳ ඇගැයීමේ දී පෙන්නුම් කරන සාර්ථකභාවයට යටත්ව මෙම ඒකකයට පූර්ණ මූල්‍ය අනුග්‍රහය දැක්විය යුතු බවට ද මෙම වාර්තාව නිර්දේශ කළේය. සාම ක්‍රියාවලිය දීර්ඝකාලීනව පවත්වා ගෙන යාමේ අපේක්ෂා සඳහා වැදගත් වන්නාවූ කාරණයක් වශයෙන් සැලකෙන සාම සාධක මෙහෙයුම්වල සිවිල් අංශ මෙම යෝජනාව මඟින් පිළිගැනීම අලුත් සහ යහපත් කාර්යයක් සනිටුහන් කිරීමක් වෙයි. ඒ අතරම එයට ප්‍රමාණවත් වශයෙන් මූල්‍ය සම්පත් ලබාදිය යුතු වේ. එමෙන්ම එකට එකතු කරගෙන සූදානම් කර තබා පිළිගෙන ඇත. ගැටුම් නිරාකරණය පිළිබඳ යථාර්ථවාදීව බලන කල අවශ්‍ය විෂයට අදාළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යුහාත්මක වෙනස් කිරීම් කීපයක් ඇත. උදාහරණයක් වශයෙන් සිවිල් පොලීසිය සහ මානව හිමිකම් විෂය පිළිබඳ විශේෂඥයන් සාම සාධක යාන්ත්‍රණය මග වඩාත් හොඳින් අනුකලනය විය යුතු වේ. මිලිටරි ආරක්ෂක කාර්යය ඵලදායී අන්දමින් පූර්ණත්වයට පත් කිරීමට සහ වර්ධනය කිරීමට මෙන්ම ඒ අතරම ගැටුම්වලට පසු සාමය ගොඩනැංවීමේ කාර්යයේ දී අනුපමේය අභියෝගවලට නිසියාකාරව පිළිතුරු දීම සඳහා වඩාත් ඵලදායී සහ ඒකාබද්ධ වූ සිවිල් කාර්යභාරයක් තිබිය යුතු බව එම වාර්තාව සඳහන් කරයි.

දැනට ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ සාම සාධන මෙහෙවරවලින් වැඩි කොටසක් තමන්ගේ කාර්යභාරයන් අර්ථ නිරූපණය කරනු ලබන්නේ සම්ප්‍රදානුකූලවයි: ඔවුහු විවිධ රටවල සටන් විරාම ගිවිසුම් සහ නිරායුද කිරීමේ ගිවිසුම් ගැන සොයා බලති. එම ස්ථාන නම් මැද පෙරදිග, ඉන්දියාව හා පකිස්ථානය, ජියෝර්ජියාව සහ ඉතියෝපියාව හා එරිට්‍රියාව වේ) වඩාත් බලවත් අභියෝගාත්මක පරමාර්ථ වන්නේ පොලිස් කටයුතු හා නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමයි. වර්තමානයේ දී මෙය බොස්නියා, කොසෝවෝ මහා නැගෙනහිර ටිමෝරයේ සාම සාධන මෙහෙයුම්වල දී අවශ්‍ය වී ඇත. එහිදී පොලිස් කටයුතු සහ ගැටුම් නිරාකරණ කටයුතු වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව මතු වී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී කොංගෝ ජන රජය තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මෙහෙවර (MONUC) පූර්ණ ආකාරයෙන් මෙහෙයවා ඇත්නම් මෙම වාර්තාවේ හඳුන්වා දී ඇති පාඩම් සමූහයම මෙහෙයුමට සම්පූර්ණ වශයෙන් ඒකාබද්ධ කර ගැනීම අවශ්‍ය වේ.

8. අනාගත විකල්ප

සාම සාධනය සහ ගැටුම් නිරාකරණය එකම විෂයයක් සම්බන්ධයෙන් කතා කිරීමට ආරම්භ කර ඇති අතර, ප්‍රායෝගික වශයෙන් ක්ෂේත්‍ර දෙකට අදාළ සංකල්ප වඩාත් හොඳින් භාවිත කිරීම පිළිබඳව ක්‍රියාකාරී වශයෙන් බොහෝ දේ ඉගෙනීමට ඇත. එක්සත් ජාතීන් තුළ පමණක් නොව ජාතික හා ප්‍රාදේශීය ආරක්ෂක සංවිධාන තුළත් සාමයට දක්වන, සහයෝගය, ගැටුම් වැළැක්වීම සහ ගැටුම් නිරාකරණය වැනි සංකල්ප ක්‍රමයෙන් වලංගු භාවයට ලක් වන විට එහි අත්‍යවශ්‍ය වීමේ ස්වභාවය වැඩි වෙයි.

යුරෝපා සංගමයේ ගැටුම් වැළැක්වීම සහ ගැටුම් නිරාකරණයට සාපේක්ෂව ගත් කල කොසෝවෝහි සිද්ධීන් ප්‍රතිපත්ති සංවර්ධනය ගැන සිතීමට උනන්දු කරවන බලපෑමක් විය. පොදු යුරෝපා සුරක්ෂිතභාවයක් සඳහා වන නව පාදක ව්‍යූහයක් මේ අතර මතු වෙමින් පවතී. ඒ සම්බන්ධයෙන් ද ගැටුම් නිරාකරණය වනු ඇත. පොදු විදේශ සහ සුරක්ෂා ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට කැඳ වූ යුරෝපා සුරක්ෂා සහ ආරක්ෂක අනන්‍යතාවය පිළිබඳ .... සංගමය මගින් දියත් කරන ලදී. හෙල්සිංකි නුවර පැවැත්වූ දෙසැම්බර් සමුළුවේදී 50,000 ටත් 60,000 කටත් අතර වූ භට පිරිසකගෙන් සමන්විත යුරෝපා සංගමය යටතේ ක්‍රියාත්මක වන ක්ෂණික ප්‍රතික්‍රියා බලකායක් වර්ධනය කිරීම සහ අර්බුද අවස්ථාවන්හිදී විහිදුවීම සඳහා සිවිල් සම්පත් භාරයක් ඇති කිරීම වැනි ප්‍රකාශිත පරමාර්ථ හෙළි දක්වන ලදී. දෙදාහේ වර්ෂයේ ජූනි මාසයේ දී ශාන්තා මරියාහි පැවැත්වූ යුරෝපා කවුන්සිලයේ රැස්වීමේදී ජාත්‍යන්තර මෙහෙවර වැළැක්වීම් හා අර්බුද කළමනාකරණ කාර්යභාරයන් ශක්තිමත් කිරීම සඳහා 2003 වසර වන විට 5000 කින් සමන්විත සිවිල් පොලිස් හමුදාවක් සැපයීමට සාමාජික රාජ්‍ය තම කැමැත්ත ප්‍රකාශ කළේය. නියමිත කාලය තුළ ප්‍රතිචාරයක් දක්වන බව තහවුරු කර ගැනීම සඳහා දින 30 ක කාලයක් ඇතුළත එක් දහසකින් සමන්විත සිවිල් පොලිස් බලාකයක් සපයනවා ඇත. 1999 නොවැම්බර් මාසයේ දී ඉස්තාන්බුල් නගරයේ පැවැත් වූ මහ සමුළුවේදී යුරෝපයේ සුරක්ෂාව සහ සහයෝගීතාව සඳහා වූ සංවිධානය (OSCE) ද ක්ෂණික විශේෂ ආධාර සහ සහයෝගතා කණ්ඩායම් (REACT) පොරොන්දු විය (ප්ලේච් සහ සීමෝර් 2002.12).

සාම කටයුතුවලට ආධාර කිරීමට හා අර්බුද කළමනාකරණ අවස්ථාවන් සඳහා යොදවා ඇති අයගේ සිවිල් හැකියාවන් ශක්තිමත් කිරීමට දරන්නා වූ වෑයම පිළිබඳව බොහෝ විචාරකයෝ බලවත් සේ කනස්සල්ලට පත්වෙමින් සිටිති. ඔවුන්ගේ නිරීක්ෂණ වී ඇත්තේ මිලිටරි කාර්යයන් සඳහා යොදවා ඇති කොටස්වලට ඕනෑ තරම් සම්පත් ලබාදෙන අතර සිවිල් කොටස්වල සාමය ගොඩනැංවීමේ පියවර සඳහා ආධාර වශයෙන් ලබාදෙන සම්පත් බොහෝ සේ ප්‍රමාණවත් නොවන තත්ත්වයක පවතී. සිවිල් කොටස්වලින් සමන්විත යුරෝපය සඳහා වූ ගැටුම් වැළැක්වීමේ සේවයක් සෑදීම මෑතකදී බ්‍රිතාන්‍ය ඇමෙරිකානු සුරක්ෂා තොරතුරු කවුන්සිලය (BASIC) යෝජනා කළේය. බොස්නියාවේ SROR හි කොටසක් වශයෙන් සහ කොසොවෝ KFOR හි කොටසක් වශයෙන් කටයුතු කළ ඉතාලියානු කැරාබිනියෙරි වැනි බෝල්කන් ඒකකවල සිටි අර්ධ මිලිටරි පොලිස් ඒකක යෙදවීමෙන් ලැබූ අත්දැකීම් සඳහා ප්‍රයෝජනයට ගත හැකිය.

මෙම යෝජනාව එක්තරා ආකෘතියක් ඉදිරිපත් කරයි. එනම් මෙය යටතේ බලඇණි වශයෙන් හෝ ඒ හා සමාන අර්ධ මිලිටරි හමුදා ව්‍යූහයක් වශයෙන් හෝ මනා ආරක්ෂාවක් ලබාදිය හැකි සිවිල් කණ්ඩායම් ක්‍රියාන්විත කළ හැකිය. මෙහි පරමාර්ථය වන්නේ ගැටුම් වැළැක්වීම හෝ සාමය නැවත ඇති කිරීමේ පූර්ණ සේවා පද්ධතියක් සැලසීමයි. ඒ අනුව එය මිලිටරි සුරක්ෂා කටයුතුවලට ඌන පූරකයක් වනු ඇත. සුරක්ෂිතතාව අවම තලයක පවතින සහ අතිශය උත්සන්න අවස්ථාවන්හි දී විහිදුවනු ලන්නා වූ බලඇණිවල සංයුතිය අවශ්‍යයෙන්ම වැඩි ප්‍රමාණයක් අර්ධ මිලිටරි පොලිස් භටයන් විය යුතුය. අවම උත්සන්න අවස්ථාවලදී සාපේක්ෂ වශයෙන් හමුදාවල සිවිල් විශේෂඥයන් වැඩි ප්‍රමාණයක් සිටිය හැකිය. ඒ සිවිල් සමාජය විශේෂඥ දැනුම්වලින් ශක්තිමත් කිරීම සඳහාය. උදාහරණ වශයෙන්, මානව හිමිකම්, මැදිහත්වීම්, අධි පාලනය සහ පොලිසි සහ නෛතික පුහුණුව දැක්විය හැකිය.

වඩාත් ස්ථාවර තත්වයන් පවතින අවස්ථාවල දී මිලිටරි අණ දෙන නිලධාරියෙකුගේ ඍජු පාලනය යටතේ ශක්තිමත් කරන ලද බල ඇණියක් තැබිය හැකිය. බොස්නියාවේ දී විහිදුවන ලද විශේෂිත පොලිස් ඒකක මත පදනම් වූ මෙහෙයුම් හමුදා මණ්ඩලයක් අවශ්‍ය වන පරිදි ප්ලැටූන ප්‍රමාණයේ ඒකක වලින් සමන්විත වනවා ඇත. එම ඒකක වන්නේ අපරාධ හා යුද අපරාධ විමර්ශකයන් සහ බුද්ධි විශේෂඥයන්, මහජන සුරක්ෂාව සඳහා ප්ලැටූන (කැරැළි මර්දන පොලිස් භටයන්) මැදිහත්කරණය සඳහා පුහුණු කරන ලද විශේෂඥ කණ්ඩායම්, මානව හිමිකම් නිරීක්ෂණයින්, අධි පාලන, පොලිස් කාර්යය සහ යුද අවි එකතු කිරීම සහ විනාශ කිරීම සඳහා වන කොටස්ය. එවන් බල ඇණියකට අයත් විය හැකි ප්‍රාදේශීය පොලිස් කණ්ඩායම බුද්ධි තොරතුරු එක්රැස් කර ගැනීම, ඔත්තු බැලීම සහ අරගල සමථයකට පත් කිරීම සඳහා යෙදවිය හැකි අඩු වශයෙන් සන්නද්ධ ප්‍රහාරක වාහනවලින් සමන්විත වනු ඇත.

එවන් හමුදාවක් සඳහා වන වාර්ෂික පිරිවැය BASIC සැලැස්මේ ගණන් බලා ඇති අන්දමට විහිදුවිය හැකි 12,000 කින් මෙන්ම තවත් ප්‍රධාන කාර්යාල සහ පුහුණු කාර්ය මණ්ඩල ආධාරක පිරිසක් වන 3000 කින් යුත් හමුදාවකට දළ වශයෙන් ඩොලර් බිලියන දෙකක් පමණ වැය වේ. මෙය යුරෝපීය සංගමය/ උතුරු අත්ලාන්තික ගිවිසුම් සංවිධානයේ (EU/ NATO) සාමාජික රටවල වාර්ෂික සම්ප්‍රදායානුකූල මිලිටරි අයවැය වන ඩොලර් බිලියන 156 සමග ගැලපේ. තවද එක්සත් ජාතීන්ගේ

සාම සාධක මෙහෙයුම් සඳහා තීරණය කර ඇති වර්තමාන වාර්ෂික අයවැය ද දළ වශයෙන් ඒ හා සමාන වන්නේය.

මෙම විශේෂ යෝජනාව අර්ධ මිලිටරි ආකෘතියක ව්‍යුහයන් අති මහත් අන්දමින් පදනම් කරගෙන තිබිය හැකි නමුත් එය හදිසි අවශ්‍යතාවක් ගැන පෙන්වා දීමක් කරයි. එය නම් සිවිල් අර්බුද කළමනාකරණය සහ ගැටුම් නිරාකරණ / වැළැක්වීම් විශේෂඥතා දැනුම යොදා පවතින මිලිටරි සාම සාධක හැකියාවන් ශක්තිමත් කිරීමේ කාර්යය වෙත ගැඹුරු විය යුතු බවයි. ඒ ආකාරයෙන්ම ප්‍රවණතාවක් අනුගමනය කරමින්, මිලිටරි සුරක්ෂා අභියෝග දැඩි ලෙස ' නිල් හෙල්මට' යන්ගේ ලෝකයට සීමා කොට දේශපාලන, මානව හිමිකම්, සහ සාම සාධන කාර්යයන්හි සිවිල සමාජ ගොඩනැංවීම ආදියේ වගකීම බාර ගැනීම සඳහා සිවිල් විශේෂඥයන්ගෙන් සමන්විත 'සුදු හෙල්මට' විශේෂ ඒකක නිර්මාණය කිරීමට 1990 ගණන්වල මුළු කාලය තුළදීම එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ නිරන්තර ඉල්ලීම් පැවතුණි. 1995 දෙසැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අංක A-50-19 දරණ 'සුදු හෙල්මට ආරම්භය' (වයිට් හෙල්මට් ඉනිෂියේටිව්) යෝජනාව සම්මත කර ගන්නා ලදී. යෝජනා කරන ලද්දේ ආර්ජන්ටිනාවයි. එය සැලසුම්කර ඇත්තේ එක්සත් ජාතීන්ගේ සාම සාධන මෙහෙයුම්වලට සහයෝගය දක්වන සංවර්ධන රටවල අතිරික්ත ධාරිතාව ශක්තිමත් කිරීමටය. මෙයට සමීපවම ඉදිරිපත් වූ නෙදර්ලන්ත යෝජනාව වූයේ හදිසි අවස්ථාවන්හි දී සහ ස්වභාවික ආපදා තත්වයන්හි දී යෙදවිය හැකි ජාත්‍යන්තර සිවිල් ස්වේච්ඡා බල සේනාවක් ගොඩනැංවීමය.

මිලිටරි නොවන්නා වූ සාම සාධක ක්‍රම සංවර්ධනය කිරීම ගැන ද නෝර්වේ රාජ්‍යය මගින් ද පුරෝගාමීව කටයුතු කර ඇත. 1990 ගණන්වල මුල් භාගයේදී නෝර්වීජියානු ආණ්ඩුව නෝර්වීජියානු පෙර සූදානම් පද්ධතියක් (NOREPS) ස්ථාපනය කිරීමට සහයෝගය දැක්වීය. මෙය රාජ්‍ය නොවන සංවිධාන ජාලයකි. එයින් සපයනු ලැබුවේ හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගන්නා සැලසුම් පද්ධතියකි (මෙය NORSTAFF යනුවෙන් නම් කෙරේ). පැය 72 ක් ඇතුළත විවිධාකාර වූ ක්ෂේත්‍ර රාශියකින් සිවිල් විශේෂඥයන් ලබාදීමට මෙහිදී ඉඩ ලැබේ. 1980 ගණන්වල සිට ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් සඳහා වන නෝර්වීජියානු සම්පත් බැංකුව එක්සත් ජාතීන්ගේ ආයතන හෝ ගැටුම්වලට සම්බන්ධ පාර්ශවයන්ගෙන් ලැබෙන ඉල්ලීම් අනුව සහන සේවා කණ්ඩායම්, මානව හිමිකම් නිරීක්ෂකයන් සහ සමථකරුවන් කණ්ඩායම් වශයෙන් යැවීමට ක්‍රියා කළේය.

සිවිල් ගැටුම් නිරාකරණ ධාරිතාවට සහයෝගයක් වශයෙන් සම්පත් ලබාදීමට සාමාන්‍යයෙන් සාමාජික රටවල කැමැත්ත සහ හැකියාව සීමිත සහ කනස්සලු සහගත නමුත් මේ ආකාරයේ පරමාදර්ශ රාශියක් දැන් දකින්නට තිබේ. 1990 ගණන්වලදී ක්‍රියාත්මක කළ වූ සාම සාධක කටයුතුවලින් ඉගෙනගත් පාඩම්වලින් පැහැදිලි කර දෙන්නේ පොදුවේ ජාත්‍යන්තර ප්‍රජාවන් විශේෂයෙන් එක්සත් ජාතීන් ද අනාගතයේ ගැටුම් සාමකාමීව නිරාකරණය කිරීමේ දී සාර්ථක කාර්යභාරයක් ඉටු කිරීමට නම් ඉතා දැඩි ආකාරයෙන් මෙම ප්‍රශ්නය අවධානයට ලක් කළ යුතු වේ.

9. ආශ්‍රිත ග්‍රන්ථ සහ අතිරේක කියවීම්

Annan, K. 1997. "Peace Operations and the United Nations: Preparing for the New Century," *Conflict Resolution Monitor,* Issue 1, (Centre for Conflict Resolution, Department of Peace Studies, University of Bradford).

Azar, E. 1990. *The Management of Protracted Social Conflict: Theory and Cases,* Darmouth: Aldershot.

Beattie, Clayton 1983 "Canadian Army," in H. Wiseman (ed.), *Peacekeeping: Appraisals and Proposals,* Oxford: Pergammon Press.

Betts, R.K. 1994. "The Delusion of Impartial Intervention," *Foreign Affairs,* 73, 6, 20-33.

British Army 1994. *Field Manual: Wider Peacekeeping,* Fourth Draft, London.

Call, Chuck and Michael Barnett 2000. "Looking for A Few Good Cops: Peacekeeping, Peacebuilding and CIVPOL," in Holm and Eide, op. cit., 43-68.

Chayles, A.H. and G.T. Raac 1995. *Peace Operations: Developing an American Strategy,* Washington DC: National Defense University Press.

Dobbie, C. 1994. "A Concept for Post Cold War Peacekeeping," *Survival,* 36, 121-148.

Holm, T. Tanke and E. Barth Eide (eds.) 2000. *Peacebuilding and Police Reform,* London: Frank Cass.

Langille, P. 2000. "Conflict Prevention: Options for Rapid Deployment and UN Standing Forces," in Ramsbotham and Woodhouse, op. cit., 219-253.

Last, D. 1997. *Theory, Doctrine and Practice of Conflict De-Escalation in Peacekeeping Operations,* Nova Scotia: Lester B. Pearson Canadian International Peacekeeping Training Centre.

Last, D. 2000. "Organising for Effective Peacebuilding," in Ramsbotham and Woodhouse, op. cit., 80-96.

Luttwak, Edward. 1999. "Give War a Chance," *Foreign Affairs,* 78, 4.

Miall, H., O. Ramsbotham and Tom Woodhouse 1999. *Contemporary Conflict Resolution*, Cambridge: Polity Press.

Ministry of Defence 1999. *Peace Support Operations:* JWP 3-50, London: Ministry of Defence.

OSCE 1999. "Report of the OSCE Mission in Kosovo," in *UNHCR/OSCE Overview of the Situation of Ethnic Minorities in Kosovo.*

Plesch, D. and J. Seymour 2000. *A Conflict Prevention Service for the European Union,* Washington, DC and London: BASIC.

Ramsbotham, Oliver and Tom Woodhouse 1996. *Peacekeeping: Terra Incognita – Here Be Dragons – Peacekeeping and Conflict Resolution in Contemporary Conflict: Some Relationships Considered,* Ulster: University of Ulster, INCORE/United Nations University.

Ramsbotham, Oliver and Tom Woodhouse 1996. *Humanitarian Intervention in Contemporary Conflict: A Reconceptualisation,* Cambridge: Politica Press.

Ramsbotham, Oliver and Tom Woodhouse (eds) 2000. *Peacekeeping and Conflict Resolution,* London: Frank Cass.

Rieff, D. 1994. "The Illusions of Peacekeeping," World Policy Journal, 11, 3, 1-18.

Sharp, Jane 2000. *Evidence to Foreign Affairs Committee. Fourth Report on Kosovo. Vol. II,* London: House of Commons.

Stewart, R. 1993. *Broken Lives: A Personal View of the Bosnian Conflict,* London: Harper Collins.

United Nations 1999a. *Report on the Fall of Srebrenica, A54/549,* New York, NY, United Nations.

United Nations 1999b. *Report Of The Independent Inquiry Into The Actions Of The United Nations During The 1994 Genocide In Rwanda,* New York: United Nations.

United Nations 2000a. *Comprehensive Review Of The Whole Question Of Peacekeeping Operations In All Their Aspects,* Doc A / 55 / 305; S / 2000 / 809, New York: United Nation.

United Nations 2000b. *Multidisciplinary Peacekeeping: Lessons From Recent Experience,* New York, NY: UN Department of Peacekeeping Operations at *http://www.un.org/depts/dpko/view.htm.*

Wilkinson, P. 2000. *Peace Support Under Fire: Lessons from Sierra Leone Briefing Series,* Brussels: International Security Information Service.

Woodhouse, T. 1999. *International Conflict Resolution: Some Critiques and a Response, Working Papers,* Bradford: Centre for Conflict Resolution, University of Bradford.